# වාර්ෂික වාර්තාව සහ ගිණුම්
# 2011




IPS

## ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

IPS

# සභාපතිතුමාගේ පණිවිඩය

2011 වර්ෂය තුළදී ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ කාර්ය සාධනය පිළිබඳව ආපසු හැරී බලමින් සමාලෝචනය කිරීමට ලැබීම මාහට විශාල සතුටකි. වසර තිහකට ආසන්න කාලයක් තිස්සේ පැවති බෙදුම්වාදී යුධමය තත්ත්වයන් අවසානයට පැමිණීම නිසා 2009 වර්ෂය මැදදී ශ්‍රී ලංකාවට සාමය නැවත උදාවිය. රට තුළ මහජනතාව මෙන්ම සංවිධාන සහ ආයතන සාමය නැවත පැමිණීමත් සමගම විශාල ප්‍රතිලාභයන් බලාපොරොත්තු විය. රටෙහි දේශපාලන පරිසරය තුළ 2009 වර්ෂයේ සිදුවූ මෙම වෙනස්වීම් ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2010 වාර්ෂික වාර්තාවේ සුභවාදී බලාපොරොත්තු සහිතව සඳහන් කරන ලදී. 2010 වර්ෂයේදී සාමය සහ ආරක්ෂාව විසින් ඇතිකරන ලද ආර්ථික වර්ධනය, ස්ථාවරත්වය සහ මානව සංවර්ධනය සඳහා වන සතුටුදායක තත්ත්වයන් 2011 වර්ෂය තුළදීද අඛණ්ඩව පැවතිණි. විශේෂයෙන් බෙදුම්වාදී යුද්ධය දැඩිලෙස බලපාන ලද ප්‍රදේශයන්හි ප්‍රතිසංස්කරණය, ප්‍රතිසන්ධානය සහ සංවර්ධනය ඉහළ නැංවීමේ නිල උත්සාහයන් ක්‍රමයෙන් වේගවත් වීමක් සිදුවිය. මේවා කලින් බෙදුම්වාදයට සහ බෙදුම්වාදී යුද්ධමය තත්ත්වයන්ට රට තල්ලු කරන ලද ගැටළුවලට ජාතික සමගිය ගොඩනැගීමේ හා ස්ථිර සාමයක් ඇතිකිරීමේ දේශපාලන විසඳුම් පිළිබඳ බලාපොරොත්තු ඇති කරන ලදී. මෙම වාර්ෂික වාර්තාව තුළින් සමාලෝචනය කරනු ලබන වර්ෂය තුළ මෙවැනි ප්‍රධාන සමාජ-දේශපාලන තත්ත්වයන් සැබැවින්ම අතිශයින් ඉතා ප්‍රයෝජනවත් වන අතර ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රගතිය සඳහා මතු බලාපොරොත්තු සහගත විය.

පැවති සමාජ-දේශපාලන පරිසරය තුළ මෙවැනි සතුටුදායක තත්ත්වයන් සම්බන්ධ කරමින්, අභ්‍යන්තර සංවර්ධනයන් කිහිපයක් ආයතනයේ කාර්යය සාධනය ශක්තිමත් කිරීම සඳහා මෙම වර්ෂය තුළ දායක විය. පළමුවෙන්ම, පසුගිය වර්ෂය තුළ නිදහස් චතුරශ්‍රයේ ආයතනයටම අයත් ස්ථානයකට පැමිණීමත් සමගම, ස්ථාවරව සහ යෝග්‍ය යටිතල පහසුකම් සහිතව රාජකාරි කිරීම සඳහා ආයතනය ස්ථාවර වී ඇත. සමාලෝචනය කරනු ලබන වර්ෂය නව පරිශ්‍රයේදී ආයතනයේ පළමු සම්පූර්ණ රාජකාරි වර්ෂය විය. ආයතනයේ සියලුම සමාජිකයින් ඔහුන්ගේ නව සේවා ස්ථානය සම්බන්ධව සතුටට සහ සෑහීමට පත්වී සිටී. කොළඹ නිදහස් චතුරශ්‍රය අවට සිදු කරන සාමාන්‍ය නගර සංවර්ධන වැඩසටහන, පර්යේෂණ ආයතනයක් සඳහා සැබැවින්ම වඩා යෝග්‍ය යටිතල පහසුකම් ලබා දෙමින් ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අවට පරිසරයෙහි ආකර්ශණය වැඩි කර ඇත.

දෙවනුව, වාර්ෂික වාර්තාවේ ඉදිරි පිටුවලින් පෙන්වා දෙන පරිදි, ආයතනය විසින් පසුගිය වර්ෂයන් කිහිපය තුළ ක්‍රියාත්මක කරන ලද මානව සම්පත් සංවර්ධනය පිළිබඳ දිගු කාලීන ක්‍රියාමාර්ගයන්ගේ ප්‍රතිලාභයන් භුක්ති විඳීමට 2011 වර්ෂයේදී ආයතනයට හැකි විය. විධායක අධ්‍යක්ෂ සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් දක්ෂ ලෙස කළමනාකරණය කරනු ලබන ස්වාධීන පර්යේෂණයන්ට සම්බන්ධ ඉහළම සුදුසුකම්වලින් සහ පුහුණුවෙන් යුක්ත කාර්යය මණ්ඩලය දේශීය වශයෙන් සහ ජාත්‍යන්තර වශයෙන් යන දෙඅංශයෙන්ම මෙම ආයතනය ප්‍රතිපත්ති පර්යේෂණ පිළිබඳ ඉහළින් පිළිගත් ආයතනයක් බවට පත්කර ඇත. ප්‍රතිපත්ති ගැටළු පිළිබඳ විවේචනාත්මක දැනුවත්කිරීමක් සහිතව මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොණික යන මාධ්‍යන් දෙක හරහා ලබාදෙන මෙම ආයතනයේ පර්යේෂණ වාර්තාවන් මේ සම්බන්ධව උනන්දුවක් දක්වන උගත් සහ වෘත්තීමය පාඨකයින්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ විචක්ෂණශීලී සාමාන්‍ය ජනතාව ආකර්ශනය කරයි.

තෙවනුව, පසුගිය වර්ෂය හා සසඳන විට 2011 වර්ෂයේදී එහි මූල්‍ය ක්‍රියාකාරිත්වයේ වර්ධනය මෙම වාර්ෂික වාර්තාවේ සඳහන් වේ. වර්ෂය තුළදී වැඩි දියුණු කළ මූල්‍ය ප්‍රතිපලයන්ට කැනඩාවේ අයිඩීආර්සී අයතනයෙන් ලද ආයතණික සංවර්ධන දීමනාව මගින් සැලකියයුතු මට්ටමින් සහය විය. අන්තර් ජාතික පර්යේෂණ අරමුදල් සඳහා පිළිගත් හිඟයක් පැවති කාල සීමාව තුළදී, ආයතනය විසින් මෙම අරමුදල් ආධාරයන් ආරක්ෂා කිරීම සඳහා අන්තර් ජාතික වශයෙන් ක්‍රියාකාරීව කටයුතු කිරීමට හැකිවීම වෙනුවෙන් එයට සුභ පැතිය යුතුය. සමාලෝචන වර්ෂය තුළදී ආයතනය එහි ප්‍රතිරූපය සමාජය තුළ ශක්තිමත් කර ඇත. එහි ප්‍රචාරණ සම්මන්ත්‍රණ සහ සමුළු විශාල සංඛ්‍යාවක් නොකඩවාම ආකර්ශණය විය. ආයතනයේ පරිශ්‍රය, විශේෂයෙන් එහි සම්මන්ත්‍රණ ශාලා පහසුකම් සඳහා බොහෝ දේශීය හා ජාත්‍යන්තර නියෝජිත ආයතනයන්ගෙන් දැඩි ඉල්ලුමක් පවතී. විශේෂයෙන් සමාන මෙහෙවරයන් සහ න්‍යාය පත්‍රයන් සහිත ආසියාවේ පර්යේෂණ ආයතනයන් අතර එහි ජාත්‍යන්තර ප්‍රතිරූපය වර්ෂය තුළදී තව දුරටත් ශක්තිමත් වී ඇත.

සමාලෝචන කාලය තුළදී ආයතනයේ කාර්යයන් සඳහා උපදෙස් ලබාදුන් පාලක මණ්ඩලයේ කාර්යයන් සහ ආයතනයට කළමණාකරණ නායකත්වය ලබාදුන් විධායක අධ්‍යක්ෂවරුන් පිළිබඳව මගේ අගයකිරීම සටහන් කිරීම සඳහා මෙම අවස්ථාව උදාකර ගනිමි. මෙරට ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් එළඹෙන වර්ෂයන්හිදී දියුණු සහ ශක්තිමත් කොන්දේසි සහිත ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනයක් වශයෙන් මහත් විශ්වාසයෙන් යුතුව ක්‍රියාකාරී පරිසරය සහ මානව සම්පත් පදනම අනුව ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය දෙස බැලීමට හැකිවන බව මට සහතිකය.

**මහාචාර්ය (ගෞරව) ඩබ්. ඩී. ලක්ෂ්මන්**
**සභාපති**

IPS

# විධායක අධ්‍යක්ෂවරයාගේ වාර්තාව

2011 වර්ෂය ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය නව ප්‍රධාන කාර්යාලයේ ස්ථානගත වීමේ පළමු සම්පූර්ණ වර්ෂය සනිටුහන් කළ අතර නව පරිශ්‍රයේදී ලබාගත හැකි පහසුකම් සම්පූර්ණයෙන් භාවිතා කිරීමට හැකිවන පරිදි බොහෝ කාර්යයන් සැලසුම් කර ක්‍රියාවට නැංවීය.

වර්ෂය තුළදී ප්‍රධාන අරමුණුවලින් එකක් වූයේ ශ්‍රවණාගාරය ඇතුළත කාර්යයන් නිමකිරීමයි. 2011 ජූලි මැදදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පිරිසක් සහ ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ කාර්යය මණ්ඩලය ඉදිරියෙහිදී සභාපතිතුමා විසින් එය විවෘත කරන ලදී. එතැන් පටන්, ශ්‍රවණාගාරය අයතනයේ සම්මන්ත්‍රණ/වැඩමුළු රාශියක් සඳහා භාවිතා කරන ලද අතර, තෙවන පාර්ශ්වයන් සඳහා එය කුලියට දෙන ලදී. පසුව එය ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ නව ආදායම් මාර්ගයක් බවට පත්විය.

ආයතනයේ මූල්‍ය තත්ත්වය 2010 වර්ෂයේ ඇතිවූ පාඩුව හා සසඳන විට සමස්ථ ලාභයක් පෙන්නුම් කරමින් වර්ෂය තුළදී සැලකියයුතු වෙනස්වීමක් පෙන්නුම් කරන ලදී. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ නව ගොඩනැගිල්ල ක්‍රමක්ෂය කිරීමෙන් ලත් ආදායම සහ ටීටීඅයි (Think Tank Initiative) ප්‍රධානයෙන් ලද ආධාර මත ආදායම සහ 2010 වර්ෂයේදී රුපියල් මිලියන 30 හා සසඳන විට 2011 වර්ෂයේදී ආසන්න වශයෙන් රුපියල් මිලියන 33 දක්වා ඉහළ ගිය ව්‍යාපෘති ආදායමයි. 2011 වර්ෂයේ පැවති අඩු පොලී අනුපාතය හේතුවෙන් ආයෝජන ආදායම අඩුවීම සහ රජයේ අයවැය යෝජනාවන් හේතුවෙන් ශ්‍රී ලංකා රජයේ දායකත්වය රුපියල් මිලියන 1.3කින් අඩු කිරීම සිදු නොවුනානම් මූල්‍ය ක්‍රියාකාරිත්වය මෙයට වඩා යහපත් මට්ටමක පැවතිය හැකිව තිබුණි. 2012 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අයවැයෙන් 2011 වර්ෂයේ කාර්ය සාධනයට අන්‍යාභිමුඛව කාර්ය සාධනය වර්ධනය කිරීම අරමුණු කෙරේ.

බොහෝ සෙයින් ප්‍රමාද වූ බාහිර විගණන කමිටුව පසුගිය 2010 වර්ෂයේදී ඇති කරන ලද අතර වර්ෂය තුළදී රැස්වීම් හතරක් පවත්වන ලදී. ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ගිණුම් වැඩි දියුණු කිරීම සඳහා නව යෝජනාවන් කිහිපයක් විගණන කමිටුව විසින් සිදු කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පරිත්‍යාග අරමුදලේ තත්ත්වයද පරීක්ෂා කරන ලද අතර එය ආයතනයේ ගිනුම්වලට ඒකාබද්ධ කිරීමට හෝ නැත්නම් භාරකාර අරමුදලක් වශයෙන් ස්වාධීනව පවත්වාගෙන යාමට යෝජනාවන් සිදු කරන ලදී. මෙම යෝජනාවන් දෙකම ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පාලන මණ්ඩලය විසින් සියුම් ලෙස පරීක්ෂාවට ලක් කරන ලදී.

ආයතනය වර්ෂය තුළදී ව්‍යාපෘති 21ක් නිම කරන ලද අතර නව ව්‍යාපෘති 17ක් අත්පත් කරගනිමින් සාර්ථකත්වයට පත් විය. නව ව්‍යාපෘති අතරින් සැලකිය යුතු ව්‍යාපෘති වූයේ ශ්‍රී ලංකාව සඳහා ජාතික මානව සංවර්ධන වාර්තාවේ දෙවැන්න සකස් කිරීම, ශ්‍රී ලංකා සංක්‍රමණික පැතිකඩ සකස් කිරීම සහ ළමා සෞඛ්‍ය සහ සාධාරණත්ව ව්‍යාපෘතියයි. නිම කරන ලද ව්‍යාපෘතීන් අතරේ, ඒඩීබී -රේටා යටතේ SACEPS සඳහා සිදුකළ ව්‍යාපෘති තුනක් 2012 වර්ෂයේ එඩ්වඩ් ඇල්ගර් විසින් ප්‍රකාශිත කලාපයක් තුළ පරිච්ඡේද වශයෙන් ඇතුළත් කරනු ලැබූහ. ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 2011 අගෝස්තු මස පිහිට වූ ශ්‍රම සංක්‍රමණය පිළිබඳ උපදේශන කමිටුවද නියෝජනය කරන ලදී. එහි ප්‍රතිපලයක් වශයෙන්, සංක්‍රමණයට සම්බන්ධ කාර්යයන් පිළිබඳ ආයතනයේ පර්යේෂණයන් එහි වෙබ් අඩවිය තුළ සංක්‍රමණය පිළිබඳ ජාලයක් දියත් කිරීමේ සැලසුම් සහිතව ඉහළ වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය වර්ෂය තුළදී පහත ග්‍රන්ථයන් තුන සමගින් ප්‍රකාශනයන් 9ක් පළ කරන ලදී. ඒවානම් (i) දකුණු ආසියාවේ සංක්‍රමණ ප්‍රේෂණයන් සහ සංවර්ධනය, (ii) දකුණු ආසියාවේ වෙළෙඳාම නිදහස්කිරීම සහ දිළිඳුකම සහ (iii) ශ්‍රී ලංකාවේ වෙළෙඳපල ආර්ථික ක්‍රමයක් යටතේ ආර්ථික හා සමාජ සංවර්ධනය වේ. වර්ෂය තුළ පළකළ ලිපි 25කටත් වැඩියෙන් තිබුණු අතර ඒවා සියල්ලම වාර්තාවේ වෙනත් තැනක සඳහන්වන පරිදි මුද්‍රිත මාධ්‍යයන් තුළින් ප්‍රකාශයට පත් කරන ලදී. 2011 වර්ෂයේදී ගෝලීය තලයේ අරාබි නැගිටීම, ද්විත්ව ගෝලීය ආර්ථික පසුබෑසීම, ජපාන භූමිකම්පාව යනාදීය බල පැවැත්වූ අතර අපගේ ලිපි කිහිපයක් තුළින් ශ්‍රී ලංකා ආර්ථිකයට මෙවැනි සිදුවීම්වල බලපෑම පිළිබිඹු කරයි. 2010 වර්ෂයේදී පළකළ ලිපි සහ 2011 ප්‍රථම භාගයේ පළකළ ලිපි දේශීය බැංකුවක් විසින් සහ ටීටීඅයි ප්‍රදානයෙන් සිදුකළ අනුග්‍රාහකත්වයෙන් වෙනස් ප්‍රකාශනයන් දෙකක් වශයෙන් සම්පාදනය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්ලැග්ෂිප් ප්‍රකාශනය වන ආර්ථිකයේ තත්ත්වය මගින් ශ්‍රී ලංකාව තුළ පශ්චාත් යුධ වර්ධන අවස්ථාවන් පිළිබඳ අවධානය යොමු විය. පළමු වරට, වාර්තාව දියත් කරනු ලැබුවේ ආරම්භක සැසියට ජ්‍යෝෂ්ය

අමාත්‍යවරුන් දෙදෙනෙකුගේ සහභාගිත්වයෙන් ප්‍රධාන සම්මන්ත්‍රණයක් සමගිනි. එම අවස්ථාවට විවිධ තලයේ කොටස්කරුවන් සහභාගි විය.

වර්ෂය තුළදී, මෙම වාර්තාවේ අන් තැනක විස්තර කරන පරිදි ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් ගෘහස්ථ සම්මන්ත්‍රණ 9ක් සහ සමුළු/වැඩමුළු කිහිපයක් පවත්වන ලදී. දිළිඳුකම පිටුදැකීම සඳහා වන ජාත්‍යන්තර දිනය ප්‍රතිපත්ති සංවාදයක් සහිතව (එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතියේ ආධාරයෙන්) සමරන ලද අතර පළමු වරට යාපනය විශ්ව විද්‍යාලය සහ රුහුණු විශ්ව විද්‍යාලය සම්බන්ධ කිරීම සඳහා ශ්‍රවණාගාරයේ නව වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම් භාවිතා කරන ලදී. එක්සත් රාජධානියේ බදු සහ සංවර්ධනය පිළිබඳ අන්තර් ජාතික මධ්‍යස්ථානය සහ දේශීය කොටස්කරුවන් ඒකාබද්ධව සංවිධානය කරනු ලබන බදුකරණය පිළිබඳ සම්මන්ත්‍රණය විසින් බදුකරණය පිළිබඳ ජනාධිපති කොමිසම විසින් ආමන්ත්‍රණය කරනු ලැබූ බදු ගැටළු කිහිපයක් නැවත සලකා බලන ලදී. ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන් දෙදෙනෙක් මෙම සම්මන්ත්‍රණයේ ආරම්භක අවස්ථාවට සහභාගි විය.

ආයතනයේ පර්යේෂකයන් විශේෂයෙන් දකුණු ආසියානු කලාපයට අදාළවන ජාත්‍යන්තර සම්මන්ත්‍රණ/සමුළු කිහිපයකට සහභාගි විය. මේවාට පහත සඳහන් අවස්ථාවන්ද ඇතුළත් විය. දකුණු ආසියා සමුළුව, දකුණු ආසියා ඩයස්පෝරා සම්මේලනය, 4 වැනි දකුණු ආසියා ආර්ථික සමුළුව, සාර්ක් ව්‍යාපාරික නායකයින්ගේ පර්ෂදය, දකුණු ආසියාව ප්‍රතිනිර්මානය කිරීම පිළිබඳ ලෝක සම්මන්ත්‍රණය, සහයෝගි ආරක්ෂක වැඩ පිළිවෙළ පිළිබද 5ස් වැනි ආසියා සම්මන්ත්‍රණය, සාර්ක් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රඥාප්තිය, දකුණු ආසියාවේ පුරවැසි ආරම්භය, දකුණු ආසියාව තුළ ආර්ථික නිදහස සහ ව්‍යාපාර පරිසරය සහ කලාප සහායෝගීතාව සහ ඒකාබද්ධතාවය පිළිබඳ දැණුම බෙදා ගැනීම. අවසානයට සඳහන් කරන ලද සම්මන්ත්‍රණය තුළින් ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් නොවැම්බර් මස මුලදී මාල දිවයින් රාජ්‍යතුළ පවත්වන ලද 17වැනි සාර්ක් සමුළුව සඳහා ප්‍රතිදානයන් සිදු කරන ලදී. ආයතනයේ පර්යේෂකයින් කර්මාන්තකරණය සහ කුඩා පරිමාණ කර්මාන්ත සංවර්ධනයට අදාළ සම්මන්ත්‍රණ කිහිපයකටද සම්බන්ධ කරන ලදී.

පෙර වර්ෂයන්තුළදී මෙන්ම ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය රජය, පුද්ගලික අංශය හා දානපතියන් සමග සමීපව කටයුතු කරන ලදී. ඒවා අතර එකක් වන්නේ ඉන්දියන් සාගර විද්‍යා සහ පරිසරයේ විශිෂ්ඨතාවය පිළිබඳ මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා වන යෝජනාවක් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීමයි. පුද්ගලික අංශය සඳහා ආයතනයේ දායකත්වය ප්‍රධාන වශයෙන් කුඩා පරිමාණ කර්මාන්ත ගැටළු, සාමුහික සමාජ වගකීම- හොඳම සාමුහික පුරවැසි තිළිණය, අමතර වටිනාකම් සඳහා තේ ආනයනය නිදහස් කිරීමෙහි වාසි සහ අවාසි යනාදිය සඳහා විය. වර්ෂය තුළදී දානපතියන් සමග ආයතනයේ කාර්යය ප්‍රධාන වශයෙන් ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, ආසියා පදනම සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ පිළිවෙළ හා සමග විය. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ පිළිවෙළෙහි සහයෝගිතාවයෙන්, මෙම ආයතනය මානව සංවර්ධන වාර්තාව -2011 සහ ආසියාව සහ පැසිපික් සඳහා වන වෙළෙඳ සහ ආයෝජන වාර්තාව පළකරණ ලදී.

ආයතනයේ හැකියා වර්ධනය සහ ආයතනය ශක්තිමත් කිරීම සඳහා ප්‍රබල දායකත්වයක් වූයේ පසුගිය වසරේ මගේ වාර්තාව තුළ සඳහන් කරන ලද ටීටීඅයි දීමනාවයි. මෙම දීමනාව ආයතනයේ මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කිරීමට පමණක් නොව වාර්තාවේ අන් තැනක විස්තර කරන පරිදි දීමනාව නොලැබුනේනම් පැවැත්වීමට නොහැකිවන වැදගත් සිදුවීම් කිහිපයක් සංවිධානය කිරීම සඳහාද දායක විය. පළමු වරට, ආයතනය ශක්තිමත් කිරීම සඳහා නව අදහස් ඉදිරිපත් කිරීමට කාර්යය මණ්ඩලයට ඉඩකඩ ලබාදෙන අවස්ථාවක් සංවිධානය කරන ලදී.

කාර්යය මණ්ඩලයට ගරු කිරීමේදී, ව්‍යාපෘති කිහිපයකට ඉඩ සලසමින් සිටින අතරේ වර්ෂය තුළදී එක් පර්යේශකයෙක් පීඑච්ඩී උපාධියෙන් සුදුසුකම් ලත් අතර පර්යේෂණ කාර්යය මණ්ඩලයට නව බඳවාගැනීම් තුනක් සිදු කරන ලදී. කෙසේවෙතත්, තොරතුරු තාක්ෂණ පද්ධතිය නවීකරණය කිරීමේදී ප්‍රධාන භූමිකාවක් ඉටුකළ තොරතුරු පද්ධතියේ ප්‍රධානියා පුද්ගලික අංශයේ වෙනත් තනතුරක් ලබාගැනීම සඳහා ආයතනයෙන් ඉවත්විය. මෙය අපට අළුත් දෙයක් නොවූ අතර එවැනි කාර්යය මණ්ඩල මාරුවීම්වල ප්‍රතිඵලයක් වශයෙන් පවත්නා මෙහෙයුම්වලට බාධාවක් ඇති නොවීම තහවුරු කිරීම පිණිස ආයතනය විසින් අනර්ඝ දෙවන පෙළක් සංවර්ධනය කර ඇත. වාර්තාවේ වෙනත් තැනක විස්තර වන පරිදි වර්ෂය තුළදී කාර්යය මණ්ඩල සාමාජිකයින් බොහෝමයක් විවිධ පුහුණු වැඩ සටහන් සඳහා යවන ලදී.

අප නව ගොඩනැගිල්ලේ ස්ථානගත වීමේ සිට නව ක්ෂේත්‍රයන් කිහිපයක් ආමණ්ත්‍රණය කිරීමට අපට සිදුවිය. ගෙවත්ත සහ පොකුණු නඩත්තුව සඳහා අභ්‍යන්තර කළමණාකරණ කමිටු පත් කරන ලද අතර ගෙවත්ත/පොකුණ අලංකරණය කිරීමේදී සැලකියයුතු ප්‍රගතියක් අත් කර ගෙන ඇත. 2011 ඔක්තෝබර් මාසයේදී නිකුත් කරන ලද නව ගොඩනැගිල්ලේ අනුකූලතා සහතිකයත් සමග ආකෘතිය නිමකිරීම සඳහා ගොඩනැගිල්ලේ අමතර කාර්යයන් සිදුකරන ලදී.

සමස්ථයක් වශයෙන්, 2011 වර්ෂය ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ නව ආරම්භයක් සනිටුහන් කරයි. මෙම සුවිශේෂි 2011 වර්ෂය තුළදී සංවිධානය පෙරමුණ ගැනීමේදී ආයතනයේ පාලන මණ්ඩලයේ සාමාජිකයින් සහ කාර්යය මණ්ඩලය විසින් මා හට දක්වන ලද ඔවුන්ගේ සම්පූර්ණ අනුග්‍රහය සහ සහයෝගය වෙනුවෙන් ඔවුන්ට ස්තූතිකිරීම සඳහා මම මෙම අවස්ථාව උදාකර ගනිමි.

සමන් කැලේගම
විධායක අධ්‍යක්ෂ
2012 ජූනි

IPS

# පර්යේෂණ වැඩ සටහන්

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ වැඩ සටහන්වල මධ්‍ය අරමුණ වන්නේ ශ්‍රී ලංකාව සඳහා මධ්‍ය-කාලීන ආර්ථික ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් පිළිබඳ සාකච්ඡාවන් සහ සංවාදයන්ට නිර්මාණාත්මකව දායකවීමයි. ආයතනයේ පර්යේෂණ ප්‍රතිඵලයන් සේවා ව්‍යාප්තිය, කලාපීය විෂමතාවයන් සහ ග්‍රාමීය දරිද්‍රතාවය යනාදී මෙරටට අදාළ වන සංවර්ධන ගැටළු බොහෝමයක් ආමන්ත්‍රණය කර ඇත. වර්තමාන පර්යේෂණ වැඩ සටහන්වල අරමුණ වන්නේ දැනටමත් සිදු කර ඇති ස්වාධීන කාර්යයන් ගොඩ නැගීමත්, පර්යේෂණ පිළිබඳ පවත්නා සංවිධානයන්හි පරතරයන් හඳුනාගැනීමත් සහ ඒකාබද්ධ මධ්‍ය-කාලීන කාර්යය වැඩ සටහනක් සකස් කිරීමත්ය. රටෙහි සංවර්ධන ප්‍රමුඛතාවයන් මුණ ගැස්වීම සඳහා වඩා කල් පවත්නා සහ සාධාරණ වර්ධනයක් මුදුන් පත් කර ගැනීම සඳහා ක්‍රමෝපායන් මෙම වැඩ සටහන තුළින් සාකච්ඡා කරනු ලබයි.

ආයතනයේ පර්යේෂණ න්‍යාය පත්‍රය ජ්‍යෝෂ්ඨ කාර්යය මණ්ඩල සාමාජිකයෙක් විසින් මෙහෙයවනු ලබන අපගේ එක් එක් පර්යේෂණ ඒකකයන් විසින් ක්‍රියාවේ යොදවනු ලැබේ. එක් එක් ඒකකයක් ආයතනයේ කාර්ය පිළිබඳ සියලුම ඉසව් සම්බන්ධීකරණය කිරීම සහතික කිරීම සඳහා දියුණු කළ මධ්‍ය-කාලීන පර්යේෂණ න්‍යාය පත්‍රයක් සහිතව කටයුතු කරයි. පර්යේෂණ ඒකකයන් පහත පරිදි වේ.

- සාර්ව ආර්ථික ප්‍රතිපත්තිය
- අන්තර් ජාතික ආර්ථික ප්‍රතිපත්තිය
- කම්කරු, සේවා නියුක්තිය සහ මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය
- කර්මාන්ත, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ සහ නියාමන ප්‍රතිපත්තිය
- දිළිඳුකම සහ සමාජ සුභ සාධන ප්‍රතිපත්තිය
- කෘෂිකාර්මික ආර්ථික ප්‍රතිපත්තිය
- පාරිසරික ආර්ථික ප්‍රතිපත්තිය
- සෞඛ්‍ය කෘෂිකාර්මික ආර්ථික ප්‍රතිපත්තිය

2011දී තවදුරටත්, අපගේ පර්යේෂණ න්‍යාය පත්‍රය පුළුල් තේමාත්මක ක්ෂේත්‍රයන් හයක් කෙරෙහි අවධානය යොමු කරන ලදී. සාකල්‍යතා බහු කොණ පර්යේෂණ ප්‍රවේශයක් දෙසට මාරුවීමක් පිළිබිඹු කරමින්, මෙම වර්ෂයේදී ආරම්භ කරන ලද පර්යේෂණ අධ්‍යයනයන් ඒකක වශයෙන් නොව තේමාත්මක ඉසව් වශයෙන් වෙන් කරනු ලැබ ඇත. තේමාත්මක ඉසව් හය පහත පරිදි වේ;

1. සංක්‍රමණය සහ සංවර්ධනය
2. මානව සංවර්ධනය සහ සමාජීය යටිතල
3. පශ්චාත් යුධ වර්ධනය
4. බාහිර තරගකාරිත්වයන්
5. දිළිඳුකම සහ අනතුරට පත්විය හැකිවීම
6. නවීකරණයන් සහ බාහිර වර්ධන කාරකයන්

ආයතනයේ පර්යේෂණ වැඩ සටහන් සඳහා ආයතනයේ අරමුදල්වලින් මෙන්ම දේශීය සහ ජාත්‍යන්තර යන දෙඅංශයෙන්ම හවුල්කරුවන් සහිතව සහයෝගිතා ව්‍යාපෘති හරහා බාහිර අරමුදල් වලින් මූල්‍යමය වශයෙන් ආධාර කරනු ලැබේ.

IPS

## ගෘහස්ථ සම්මන්ත්‍රණ

| මාතෘකාව | ඉදිරිපත් කිරීම | දිනය |
|---|---|---|
| The TRIPs ගිවිසුම සහ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය | ඩිලානි හිරිමුතුගොඩගේ, පර්යේෂණ සහකාර, IPS | පෙබරවාරි 11 |
| සේවාවන්හි වෙළෙඳාම නවීකරණය | මහාචාර්ය එච්. එන්. තේනුවර, සහකාර මහාචාර්ය, අයිඕවා විශ්ව විද්‍යාලය, සහ හිටපු සහකාර පාලක, ශ්‍රී ලංකා මහ බැංකුව | අප්‍රේල් 26 |
| ශ්‍රී ලංකාව තුළ විදේශ සෘජු ආයෝජන: මැලේසියාව සහ අනාගත විභව්‍යතාවයන් සන්සන්දනය කිරීමක් | ආචාර්ය චාලක සුභසිංහ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | මැයි 26 |
| බදුකරණය, පාලනය සහ සංවර්ධනය | මහාචාර්ය මික් මුවර්, වෘත්තීය සහකාර සහ ප්‍රධාන විධායක නිලධාරි, බදු සහ සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානය, IDS, සසෙක්ස් විශ්ව විද්‍යාලය | ජූලි 04 |
| ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික තත්ත්වයන් | මහාචාර්ය මික් මුවර්, වෘත්තීය සහකාර සහ ප්‍රධාන විධායක නිලධාරි, බදු සහ සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානය, IDS, සසෙක්ස් විශ්ව විද්‍යාලය | ජූලි 04 |
| ශ්‍රී ලංකාව තුළ ආර්ථික කාර්යයන් පිළිබඳ කාරකයක් වශයෙන් ප්‍රවාහන අංශය පවත්වා ගෙන යා හැකිද? | ආචාර්ය ලලිතසිරි ගුණරුවන්, ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය, ආර්ථික දෙපාර්තමේන්තුව, කොළඹ විශ්ව විද්‍යාලය | සැප්තැම්බර් 14 |
| ශ්‍රී ලංකාව තුළ සැබෑ වුවමාරු අනුපාතිකය සහ ව්‍යුහමය වෙනස්වීම අතර සම්බන්ධයක් පවතීද? | ෆ්‍රැන්සිස් රෝවේ, ජ්‍යෙෂ්ඨ ආර්ථික විද්‍යාඥ ශ්‍රී ලංකාව සහ මාල දිවයින, දකුණු ආසියා කලාපය, ලෝක බැංකුව | නොවැම්බර් 01 |
| 2011 ආදායම් බදු ප්‍රතිසංස්කරණයන්හි ගම්‍යාර්ථය සහ රාජ්‍ය සේවකයින් උ.වි.ගෙ. බද්දට යටත් කිරීම | ප්‍රියන්කා ජයවර්ධන, පර්යේෂණ නිලධාරි, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය | නොවැම්බර් 23 |
| ආසියා FTAs: නැම්යාවන්,අපේක්ෂාවන් සහ අභියෝගයන් | ආචාර්ය ගනේෂන් විග්නරාජා, ප්‍රධාන ආර්ථික විද්‍යාඥ, ප්‍රාදේශිය ආර්ථික ඒකාබද්ධතා කාර්යාලය, ආසියානු සංවර්ධන බැංකුව, මැනිලා | දෙසැම්බර් 21 |

# IPS

## 2011 - ප්‍රකාශනයන්



### 2010 සෞඛ්‍ය සංඛ්‍යා ලේඛන

මෙය පෞද්ගලික, සමූපාකාර සහ වතු රෝහල් සංගණනය පිළිබඳ 4 වැනි අනුගාමී ප්‍රකාශනය වන අතර ඉන් 2005-2008 අතර කාලය ආවරණය වේ. අධ්‍යයනය කරගෙන යනු ලබන්නේ ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ  ශ්‍රී ලංකා ජාතික සෞඛ්‍ය ගිණුම්වලට අතිරේකයක් වශයෙනි.

2006දී, ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව තුළ පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම, නියාමණය කිරීම සහ පරික්ෂා කිරීම සඳහා සහ අංශයේ සංවර්ධනය වැඩි කිරීමට අවශ්‍ය යටිතල සපයාදීම සඳහා පෞද්ගලික වෛද්‍ය ආයතන නියාමනය කිරීමේ පණත පනවනු ලැබුහ.

වැඩ ප්‍රමාණය රජයේ රෝහල් සහ පුද්ගලික රෝහල් අතර නිල නොවන මට්ටමින් බෙදා ගැනීම හේතුවෙන් අද ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ආරක්ෂණ පද්ධතිය විශ්වාසනීය ප්‍රමිතියක් පවත්වාගෙන යයි.

පුද්ගලික සෞඛ්‍යය පහසුකම් විසින් බටහිර සෞඛ්‍ය ආරක්ෂණ සහ ආයුර්වේද, හොමියෝපති සහ චීන සාම්ප්‍රදායික ඖෂධ යන දෙවර්ගයේම ආරක්ෂණයන් ලබා දේ. බටහිර ඖෂධ ආරක්ෂණ සහ සේවාවන් විසින් ලබා දෙන පුද්ගලික සෞඛ්‍යයෙන් වැඩි කොටසක් විශාල වශයෙන් ජංගම ඒවාය. පුද්ගලික රෝහල් අංශය තුළ ලබාදෙන සෞඛ්‍ය ආරක්ෂණයෙන් වැඩි කොටස සිදු කරනු ලබන්නේ පුද්ගලික අංශයේ සේවයේ යෙදීම සඳහා ලබාගත හැකි ප්‍රතිපාදන භාවිතා කරමින් රජයේ රෝහල්වල සේවයේ නියුතු වෘත්තීමය වෛද්‍යවරුන් විසිනි. රජයේ රෝහල්වල සේවයේ නියුතු වෛද්‍යවරුන්හට දෛණික රාජකාරි කිරීම සඳහා වෙන්කරන ලද කාලය අවසන් කිරීමෙන් පසු පෞද්ගලික වෛද්‍ය සේවයේ නියුතුවීමට අවසර ලබාදී ඇත. පෞද්ගලික අංශයේ වෛද්‍ය සේවාවන් මෙවැනි රෝහල්වල වැඩකරනු ලබන රජයේ වෛද්‍යවරුන්ගේ හැකියාව මත ප්‍රධාන වශයෙන් රඳා පවතී. රෝහල් සුළු ප්‍රමාණයක් ප්‍රධාන වශයෙන් ඔවුන්ගේ ආයතනයන්හි හදවත් රෝග සැත්කම් සඳහා වැඩිවන ඉල්ලුම සපුරාලීම සඳහා  විදේශ වෛද්‍යවරුන් සේවයේ යොදවා ඇත.
http://www.ips.lk/publications/series/healthecon.html

### 'Talking Economics' ආර්ථික සඟරාව (2010 ජනවාරි - දෙසැම්බර්)



මෙම සඟරාව 2010 වර්ෂයේ ආර්ථික සාකච්ඡාවන් පිළිබඳ මෙම ආයතනය විසින් අන්තර් ජාලයේ පළකළ ලිපිවල එකතුවකි.  ඒවා ජාත්‍යන්තර ආර්ථික ක්ෂේත්‍රය ගතිකව වෙනස්වීමේ සිට දේශීය දිළිඳුකම තුරන් කිරීම සහ සංවර්ධනයෙදී විවේචනාත්මක තේමාවන් දක්වා පෙළ ගැසේ. සඟරාවේ ලිපි තුනෙන් 2011 අයවැය තුළින් නිවේදනය කරන ලද සමාජ ආරක්ෂණය, අධ්‍යාපනය සහ දුරකථන බදු සඳහා යෝජිත ප්‍රතිසංස්කරණයන් විමර්ශණය කරයි.

Blog 'Talking Economics': www.ips.lk/talkingeconomics

### ශ්‍රී ලංකාව: ආර්ථිකයේ තත්ත්වය- 2011 වාර්තාව
### *තේමාව: පශ්චාත් යුධ වර්ධනය:*




සඟරාව ආරම්භ වන්නේ අභ්‍යන්තර සහ බාහිර ආර්ථික පරිසරය යන දෙඅංශය තුළ සංවර්ධනයන්වලදී ශ්‍රී ලංකාවේ ආර්ථිකය වර්ධනය සහ ස්ථාවර කිරීමේදී ඇතිවන අවධානම් තක්සේරු කිරීමෙනි. ශ්‍රී ලංකාව වේගවත්ව නැවතත් පිබිදෙමින්, 2011 මුල් භාගයේ දළ දේශීය නිෂ්පාදන වර්ධනය අඛණ්ඩව 8%ක් සමගින් ගෝලීය ආර්ථික පරිසරය දුර්වල වෙමින් පැවතීම හේතු කොට ගෙන පවත්නා වර්ධනය රඳවා තබා ගැනීම තර්ජනයක් විය. එම අවස්ථාවේදී, ආර්ථික තත්ත්වයන් වෙනස් කිරීම සඳහා ප්‍රතිචාර දැක්වීමට සුදුසුවන නම්‍යශීලී පිසිකල්, මූල්‍ය සහ වුවමාරු අනුපාත ප්‍රතිපත්තියක් සාර්ව ආර්ථික ස්ථාවරත්වය සඳහා නැතිවම බැරිය.

ස්ථාවරත්වය මගින් යටිතලවූරු කරන වර්ධනය ශ්‍රී ලංකාවට එහි පුළුල් සමාජ-ආර්ථික සංවර්ධන අභිමතාර්ථයන් ලගාකර ගැනීම සඳහා පවතින විෂමතාවයන් සමනය කිරීමට හැකිවන වර්ධන ක්‍රියාවලියක් සඳහා ඉඩ ලබා දේ. හුදෙක් සදාචාරාත්මක මතයක සිට සියළු වර්ධනයන්ගේ යෝග්‍යතාවය හැරුණු විට, බැහැර කිරීම වර්ධනය අවහිර කරනු ලැබිය හැකි ඵලදායී සම්පත්වල ඌණ සේවා නියුක්තියකට යොමුකරන බැවින් අන්තර්ගතය ආර්ථික වර්ධනය නොනවත්වා පවත්වා ගැනීමට අවශ්‍ය වේ. වාර්තාව මගින් වේගවත් වර්ධනයක් තුළින් මහජන සේවාවන් ලබාදීමේදී විෂමතාවයන් ආමන්ත්‍රණය කිරීමට හැකි වන්නේ කෙසේද යන්න සහ ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ සමයේදී විවිධ ජනගහන කණ්ඩායම් හරහා ව්‍යාපාරික පරිසරය වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි.

කෙසේවෙතත්, අන්තර්ගත සංවර්ධනය යනු හවුල් වර්ධනය පිළිබඳව පමණක්ම නොවේ. එය වර්ධනය ඇති කිරීමේදී අර්ථාන්විතව සහභාගිවීම සඳහා ජනතාව බල ගැන්වීමක්ද වේ. මෙය ජනතාවගේ සෞඛ්‍ය සහ අධ්‍යාපනය තුළ ආයෝජනය කිරීමෙන් ජනතාව බල ගැන්වීමට හා ඔවුන්ට ඵලදායී සම්පත්වලට ප්‍රවේශවීම සඳහා සමාන අවස්ථාවන් ලබාදීමට සම්බන්ධ වේ. ශ්‍රම වෙළෙඳපලේ ඉල්ලුම හා රටේ අධ්‍යාපනය සහ සෞඛ්‍ය අංශයන්හි අවශ්‍යතාවයන් සංවර්ධනය, ජන විකාශය, තාක්ෂණික සහ වෙළෙඳපල වෙනස්කම් අනුව වෙනස් වෙමින් පවතී. මෙවැනි අංශයන්හි වෙනස් වෙමින් පවත්නා ඉල්ලුම සැපයීමේදී ශ්‍රී ලංකාව මුහුණදෙන සැලකිය යුතු අභියෝගයන් මෙම සඟරාවෙන් ගවේශණය කරයි.

සීඝ්‍ර වර්ධනය පසුපස එන අනතුරුද අත් නොහැරිය යුතුය. වර්තමානයේ ශ්‍රම බලකායෙන් 62%ක් වේයැයි ඇස්තමේන්තු කළ අවිධිමත් අංශයන්හි සේවකයන්ගෙන් විශාල කොටසක් කෘෂිකාර්මික සහ ධීවර වැනි අඩු ඵලදායී අංශයන්හි නියුක්තව සිටී. ඔවුන්ට ආර්ථික අවස්ථාවන් සඳහා සමාන ප්‍රවේශයන් පුළුල් කිරීමට සහ ඒවා ශක්තිමත් කිරීම සඳහා වන ගැටළු සහ ප්‍රතිපත්තිමය විකල්පයන් විස්තරාත්මකව මෙමඟින් විමර්ශණය කරයි. සමාජ-ආර්ථික, දේශපාලන සහ භූගෝලීය සාධක අනුව දුප්පත් අවිධිමත් සේවකයින් සහ සේවා ව්‍යුක්තිකයින් විසින් මුහුණ දෙනු ලබන අනතුරු පිළිබඳව තක්සේරුවක් සහ පවත්නා සමාජ ආරක්ෂණ ක්‍රියා මාර්ගයන් සහ ඒවායේ පරතරයන් එම විශ්ලේෂණයට ඇතුළත් වේ.

http://www.ips.lk/publications/series/soe/sri_lanka_soe_2011/sri_lanka_soe_2011.html

## 'Talking Economics' ආර්ථික සඟරාව (2011 ජනවාරි – ජූනි)




මෙම සඟරාව තුළ 2011 ජනවාරි - ජූනි දක්වා ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂකයින් විසින් අන්තර්ජාලයේ පළකරන ලද සියළුම ලිපි අඩංගුය. එම ලිපි දේශගුණික වෙනස්වීමේ සිට පාරිසරික අභියෝගයන්, සෞඛ්‍ය සහ සෞඛ්‍යාරක්ෂණ මුදල් යෙදවීම, බදුකරණ ප්‍රතිපත්ති, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන්, කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ බුද්ධිමය දේපල අයිතිවාසිකම්, ගෝලීය ආර්ථික පරිසරය තුළ ශ්‍රී ලංකාව, මධ්‍යසාර ප්‍රතිපත්තිය, දේශපාලන ආර්ථික සහ පුද්ගලික අංශ සංවර්ධනය දක්වා පෙල ගස්වා ඇත.

Blog 'Talking Economics': www.ips.lk/talkingeconomics

## ශ්‍රී ලංකාවේ වෙළෙඳපල ආර්ථික පාලනයක් යටතේ ආර්ථික හා සමාජ සංවර්ධනය, බුද්ධදාස හේවාවිතාරණ සැමරුම් කලාප 1

සංස්කරණය සමන් කැලේගම සහ දිලිනි ගුණවර්ධන විසිනි.




මෙම කලාප දෙකෙන් ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජ සංවර්ධනය පිළිබඳ පුළුල්ව ආවරණය කරන අතර වෙළෙඳපල ආර්ථිකය විවේචනාත්මකව ගවේශණය කරයි. එම කලාපයන් ශ්‍රී ලංකාවේ සැබැවින්ම පවත්නා වෙළෙඳපල ආර්ථිකය පිළිබඳව මෑත දශකයන්හිදී රට මුහුණ දුන් ප්‍රධාන ආර්ථික සහ සමාජීය ගැටළු පිළිබඳ විශ්ලේෂණයක් සහිතව සම්පූර්ණ කළ ගිණුම් ඉදිරිපත් කරයි. එකිනෙක පරිච්ඡේදයන් විසින් රාජ්‍ය මූල්‍ය සහ මුදල්, පිස්කල් ප්‍රතිපත්තිය සහ බදුකරණය, සමාජයේ විවිධ අංශයන් සහ කොටස්වලට වෙළෙඳපල ආර්ථිකයේ බලපෑම සහ ප්‍රාදේශීය විෂමතාවයන්ට සහ ආදායම් බෙදීයාමට අදාළ වන ගැටළු පෙල ගස්වමින් බොහෝ අංගයන් විමර්ශණය කරයි.

http://www.ips.lk/publications/series/economic/econmic_social_develop/economic_social_more.html

## දකුණු ආසියාවේ වෙළඳාම නිදහස් කිරීම සහ දරිද්‍රතාවය

සංස්කරණය කරනු ලැබුවේ ප්‍රේම චන්ද්‍ර අතුකෝරල, ජයතිලක එස් බණ්ඩාර සහ සමන් කැලේගම විසිනි.
2011 ජූලි මස එක්සත් රාජධානිය සහ ඇමරිකා එක්සත් රාජ්‍ය රූට්ලෙඩ්ජ් විසින් ප්‍රකාශයට පත් කරන ලදී.



වෙළෙඳාම නිදහස් කිරීම සහ දිළිඳුකම අතර සම්බන්ධය සංවර්ධන ප්‍රතිපත්ති විවාදයන්හිදී වඩාත් විවාදිත මාතෘකාවන්ගෙන් විවාදයට තුඩු දිය හැකි එකකි. මාතෘකාව පිළිබඳ පවත්නා අධ්‍යයනයන් මූලික වශයෙන් විවිධ රටවල හරස් කඩ දත්ත භාවිතා කරනු ලැබූ අතර, ප්‍රතිපත්ති විවාදය දැණුම්දීම සඳහා ස්ථිර ප්‍රත්‍යක්ෂමූල පදනමක් ලබාදීමේදී මෙම ප්‍රවේශයේ සීමාවන් පිළිබඳව වර්ධනය වන සිතුවිල්ලක් පවතී. මෙවැනි සීමාවන් එක් එක් රටවල් ඇතුළත ගැඹුරින් විශ්ලේෂණය කිරීමේ අවශ්‍යතාවය පෙන්නුම් කරයි. වෙළඳාම නිදහස් කිරීම සහ දරිද්‍රතාවය අතර සම්බන්ධතාවය විමර්ශනය කිරීමේ අරමුණින්, මෙම සඟරාවෙන් දකුණු ආසියාවේ රටවල් හතක එනම් බංගලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්තානය සහ ශ්‍රී ලංකාව යන රටවල වෙළඳ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණයන් සහ දරිද්‍රතාවය අඩුකිරීමේ ප්‍රතිපල පිළිබඳ සිද්ධි අධ්‍යයන සපයයි. දකුණු ආසියානු කලාපය පසුගිය දශක දෙක මුළුල්ලේ කලාපය ලිහිල් කිරීමේ ප්‍රතිසංස්කරණ කෙරෙහි පුළුල්ව අවධාරණය කරමින් මෙන්ම ප්‍රතිසංස්කරණයන්හි කාලය සහ ව්‍යාප්තිය අනුව රටතුළ විශේෂිත වෙනස්කම් ඉස්මතු කරමින් සහ කලාපය තුළ ලෝක දරිද්‍රතාවය විශාල වශයෙන් සංකේන්ද්‍ර කරමින් ඉතා යහපත් තුළනාත්මක අධ්‍යයනයක් සඳහා ඉඩ ලබාදේ.
http://www.ips.lk/staff/ed/publications_ed/international/trade_liberalization_poverty/trade_liberaliation_more.html

## දකුණු ආසියාවේ සංක්‍රමණය, ප්‍රේෂණ සහ සංවර්ධනය

සංස්කරණය : සමන් කැලේගම




දකුණු ආසියාවේ සංක්‍රමණය, ප්‍රේෂණ සහ සංවර්ධනය යන කෘතියෙන් සංක්‍රමණයේ ගලායාම සහ නැම්යාවන් සහ සංක්‍රමණ ප්‍රේෂණයන් සහ සංක්‍රමණ ප්‍රතිපත්ති පිළිබඳ සවිස්තර තොරතුරු රැස් කරමින් දකුණු ආසියාවේ රටවල්වල සංවර්ධනයට සංක්‍රමණයෙන් වන බලපෑම ගවේෂණය සිදු කරයි. එයින් සංක්‍රමණ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සංක්‍රමණය සහ සංවර්ධන බැඳීම් දියුණු කිරීම පිළිබඳ ඵලදායි සහයෝගීතාවය සඳහා යෝජනා කිහිපයක් සහ සංවර්ධනය ඇති කිරීමේදී ප්‍රේෂණයන්ගේ භූමිකාව පිළිබඳ සාකච්ඡා කෙරේ. දරිද්‍රතාවයෙන් ජනතාව ඔසවා තැබීම ප්‍රේෂණයන්ට තනිමව කළ නොහැකිය යන සාධකය අධිකාරීත්වයක් ගනී. අනික් අතට, ප්‍රේෂණයන්ට දරිද්‍රතාවය අඩුකිරීමට හැකියාවක් ඇතැයි යන බලපෑමේ ප්‍රමාණය සහ ආකාරය තීරණය කරනු ලබන අනෙකුත් ආර්ථික, සමාජීය සහ සංස්කෘතික සාධකයන් සමග එය පරස්පර වේ.

පුද්ගල අභිමතයන්ගේ විෂය ක්ෂේත්‍රය පුළුල් කිරීමේ සහ පුරවැසියන්ට ගෞරවයෙන් හා සමානත්වයෙන් ජීවත්වීමට හැකි පරිසරයක් නිර්මාණය කිරීමේ අරමුණින්, වර්ධනය, උන්නතිය, බලගැන්වීම සහ ප්‍රගතිය අපේක්ෂා කරමින් සංවර්ධනය ගතික ක්‍රියාවලියක් වශයෙන් අවබෝධ කරගත යුතු පසුබිමක සංවර්ධන සැළසුම්වල ප්‍රධාන ධාරාවට සංක්‍රමණය ගෙන යායුතු වන්නේ කෙසේද යන්න මෙම පොතින් පරීක්ෂා කරයි.
http://www.ips.lk/staff/ed/publications_ed/international/migration remittances_development/migration_remittances.html

## දකුණු ආසියා ආර්ථික සඟරාව

කාණ්ඩ 11, අංක 1 සහ 2, මාර්තු සහ සැප්තැම්බර්, 2011
සංස්කරණය කලේ : සමන් කැලේගම






විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல: ඊඑල්/ඒ/අයිපීඑස්/එෆ්ඒ/2011
ඔබේ අංකය / உமது இல / Your No.:
දිනය / திகதி / Date: 2012 සැප්තැම්බර් 19 දින

සභාපති,
ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය.

**ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1999 අංක 09 දරන සංශෝධිත 1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනතේ 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. එම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail: oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

---

## 2. මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

---

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පෞද්ගලික බැංකුවක ආයෝජනය කර තිබූ (ස්ථාවර තැන්පත් අංක 3-048634-130 යටතේ) රු. 82,900,000 ක මුදලක් ආයතනය සතුව ඇති නමුත් එම වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර නොතිබුණි. එම මුදල එන්ඩොමන්ට් අරමුදලට (Endowment Fund) අයත් බව මා වෙත දන්වා තිබුණද, එම ගිණුම විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 දින ආයතනය සතු ස්ථාවර තැන්පත් 06 කට අදාල ලැබිය යුතු පොලී මුදල රු. 283,599 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.387,052 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.103,453 ක් වැඩියෙන් ගිණුම් ගතවීමක් නිරීක්ෂණය විය.

(ඇ) ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලිය ගිණුම් ගත කිරීමේදී රඳවා ගැනීමේ බදු අඩුකර ගණනය කරන ලද වටිනාකම ගිණුම් ගත කිරීම හේතුවෙන් නියමිත පොලී ආදායම ගිණුම් වලින් අනාවරණය නොවන බව නිරීක්ෂණය විය.

2.2.2 නොසැසඳුණු ගිණුම් ශේෂ

---

මූල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන පහත සඳහන් අයිතමයන් හා ඊට අදාල උපයෝගී ලේඛණ අනුව රු.30,852 ක වෙනසක් නිරීක්ෂණය විය.

| අයිතමය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | උපයෝගී ලේඛණය අනුව වටිනාකම | උපයෝගී ලේඛණයේ නම | වෙනස |
|---|---|---|---|---|
| | රු. | රු. | | රු. |
| ස්ථාවර තැන්පතු ශේෂය | 11,999,000 | 12,002,154 | ශේෂ තහවුරු ලිපිය අනුව | 3,154 |
| ඉතිරිකිරීමේ ගිණුම් ශේෂය | 3,803,798 | 3,791,239 | බැංකු සැසඳුම් අනුව | 12,559 |
| භාණ්ඩාගාර බිල්පත් | 95,679,986 | 95,653,749 | ශේෂ පිරික්සුම අනුව | 13,763 |
| ලැබිය යුතු පොලිය | 3,839,901 | 3,838,525 | ශේෂ පිරික්සුම අනුව | 1,376 |
| වෙනසේ එකතුව | | | | 30,852 |

2.2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

---

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) වෙතත් ලැබිය යුතු ගිණුමේ ශේෂය තුල ඇතුලත් විදේශගත වූ නිලධාරීන් විසින් ප්‍රතිපූර්ණය කළයුතු විදේශ ගුවන් බලපත්‍ර ගාස්තු රු.851,475 ක වටිනාකමක් ඇතුලත් වූ අතර, මෙයින් රු.124,179 ක් 2008 වර්ෂයේ සිටද, රු.246,800 ක වටිනාකමක් 2009 වර්ෂය වෙනුවෙන් හා රු.259,000 ක් 2010 වර්ෂ වලට අදාල බව නිරීක්ෂණය විය.

(ආ) 2010 ගිණුම් වර්ෂය වෙනුවෙන් රු.793,845 ක මුදලක් භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ප්‍රතිපාදන ලෙස දක්වා තිබුණ අතර, 2012 විගණන අවස්ථාව වන විටත් එය ගිණුම් වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2009 වර්ෂයේ ව්‍යාපෘති අංක 297 වෙනුවෙන් ජාත්‍යන්තර පර්යේෂණ හා සංවර්ධන ආයතනයෙන් ලැබිය යුතු රු. 97,861 ක මුදල විගණන අවස්ථාව වන විටත් ලැබී නොතිබුණි.

(ඈ) 2005 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින අමාත්‍යාංශයෙන් ලැබිය යුතු වැටුප් රු.101,200 ක මුදල විගණන අවස්ථාව වන විටත් ලැබී නොතිබුණ අතර, ඒ සඳහා ගත් ක්‍රියාමාර්ගයද විගණනයට අනාවරණය නොවුණි.

(ඉ) පෞද්ගලික ආයතනයකට ගෙවිය යුතු රඳවාගත් මුදල වූ රු.4,945,668 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙහි ණයහිමි ශේෂ යටතේ දක්වා නොතිබීම හේතුවෙන් ශුද්ධ වත්කම් වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

---

(ඊ) නිමකරන ලද ව්‍යාපෘති කටයුතුවලට අදාලව 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.1,311,005 ක මුදලින් රු 216,172 ක ශේෂයක් 2010 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන මුදලක් බව නිරීක්ෂණය විය.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

---

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) අංක 2536901 දරණ බැංකු ගිණුමේ ඇති රු. 9,890 ක් වූ ශේෂය සඳහා ශේෂ තහවුරු කිරීම් ඉදිරිපත් නොවුණි.

(ආ) තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ටොරින්ටන්හි පිහිටි සමෘද්ධි පැල තවාන ඉඩමෙන් අක්කර 1/2 ක් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට ලබාදී ඒ සඳහා බදු කුලී ලෙස රු. 5,460,000 ක මුදලක් දැනට ගෙවා තිබුණද, ඒ සඳහා දීර්ඝ කාලීන බදු ඔප්පුව ලබාගෙන නොතිබුණි.

2.2.5 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 අංක 53 දරන පනත හා 1999 අංක 09 දරන ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනතේ 20 (2) වගන්තිය | ආයතනයේ කාර්ය මණ්ඩල තාවකාලිකව හෝ ස්ථිර පදනමින් පත්කල හැකි වුවත් සියළුම කාර්ය මණ්ඩල ආයතනය ආරම්භයේ සිටම කොන්ත්‍රාත් පදනමට පත්කර තිබුණි. |
| (ආ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | |
| (i) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| 9.2 (ඛ) වගන්තිය | සෑම ආයතනයක්ම අනුමත කාර්ය මණ්ඩලයක් සහ සංවිධාන සටහනක් පවත්වා ගත යුතු වුවද ආයතනය විසින් එසේ පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| 9.3(1) වගන්තිය | ආයතනයේ බඳවා ගැනීම් හා උසස් කිරීමේ පරිපාටි සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය මත මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. |
| 9.14.2 වගන්තිය | ආයතනයේ මානව සම්පත් කළමනාකරණය සම්බන්ධව පිළියෙල කරනු ලබන මෙහෙයුම් අත්පොත් සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | |
|---|---|
| 9.7 හා 9.8 වගන්තිය | අනුමත බඳවා ගැනීමේ පරිපාටියක් නොමැතිව බඳවාගෙන තිබුණ සේවකයන්ට සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා වැටුප්, දීමනා, ගෞරවාන්විත දීමනා, දිරි දීමනා වශයෙන් පිළිවෙලින් රු.32,700,274 රු.1,108,312 රු. 3,757,763 රු.3,124,766 ක් ලෙස එකතුව රු. 40,691,115 ක් ගෙවීම් කර තිබුණි. |
| (ඇ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ<br>------------------------ | |
| 2009 සැප්තැම්බර් 18 දිනැති පිඑත් 437 චක්‍රලේඛයේ 01 ඡේදය | සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රම ජාතික රක්ෂණ භාර අරමුදල වෙතින් හෝ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙතින් පමණක් සලසා ගත යුතු වුවත් ආයතනයේ සේවකයන්ට අදාල සෞඛ්‍ය රක්ෂණ සෙලින්කෝ රක්ෂණ සමාගමින් ලබාගෙන තිබුණි. |
| (ඉ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2:14:1 | (i) රු.51,678,014 ක් වූ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් (Local area network unified communication and power solution with infrastructure) අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවක් පත්කර නොතිබුණි. |
| | (ii) ශ්‍රවනාගාරය නවීකරණය හා ශ්‍රවනාගාරය සඳහා පුටු මිලදී ගැනීම සඳහා පිළිවෙලින් දරන ලද රු.495,700 ක් හා රු.2,251,334 මුදල් සම්බන්ධයෙන් විධිමත් ප්‍රසම්පාදන කමිටුවක් පත්කර නොතිබුණි. |
| | (iii) ඉහත කොන්ත්‍රාත් 03 සම්බන්ධයෙන් ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීමක් කර කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | (iv) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගැනීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සැලැස්මක්ද පිළියෙල කර නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් ප්‍රතිඵලයරු. 343,442 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 26,294,271 ක් වූ බැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 26,637,713 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ. ව්‍යාපෘති ආදායම රු.24,143,028 කින් හා ක්‍රම ක්ෂය රු.4,769,899 කින් වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2011 ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘති 16 ක් සහ වැඩමුළු 01 ක් කිරීමට සැලසුම් සකස් කර තිබුණ අතර 2011 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා එහි ප්‍රගතිය සැසඳීමට හැකි වනසේ සකස් කර නොතිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සේවක සුභ සාධක කටයුතු වෙනුවෙන් අරමුදලක් වසර 08 කට පෙර පිහිටුවා ගනු ලැබුවද මෙතෙක් නිලධාරීන්ගේ අවශ්‍යතා වෙනුවෙන් යොදා ගෙන නොතිබුණු අතර 2011 දෙසැම්බර් 31 දිනට එහි ශේෂය රු.1,176,955 ක් වූ අතර, එම මුදල භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි.

(ආ) 2006 මැයි 30 දින නෙදර්ලන්තය රජය සමඟ ඇතිකර ගත් ආධාර ගිවිසුම අනුව ගිවිසුම් කාලය 2008 දෙසැම්බර් මස නිමවිය යුතු වුවද, නියමිත කාලය තුළ ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු නිමකිරීමට නොහැකි වීම හේතුවෙන් ගිවිසුම් කාලය 2010 ජූනි 30 දක්වා දීර්ඝ කරගෙන තිබුණද, 2011 අගෝස්තු මාසය දක්වා මෙම අරමුදලින් ඉදිකිරීමේ කටයුතු සඳහා මුදල් වැය කර තිබුණි. 2011 අගෝස්තු දක්වා එච්එස්බීසී යුරෝ ගිණුම වසා නොදැමීම හේතුවෙන් ලංකා මුදලට සමානුපාතිකව 2010 හා 2011 වර්ෂ වලට අදාලව පහත සඳහන් පරිදි රු. 7,833,583 ක විනිමය අවාසියක් සිදුවී තිබුණි.

| දිනය | විස්තරය | මුදල |
|---|---|---|
| | | රු. |
| 2010-12-31 | විනිමය අවාසිය | 4,883,138 |
| 2011-09-28 | විනිමය අවාසිය | 2,348,122 |
| 2011-09-30 | ගොඩනැගිලි අරමුදලේ ස්ථාවර තැන්පත් අලාභය | 2,952,012 |
| 2011-01-01 | විනිමය වාසිය | ( 2,349,689) |
| | | 7,833,583 |

(ඇ) ව්‍යාපෘති නිමකර වියදම ආදායම හඳුනාගෙන ගිණුම්ගත කිරීමේදී ඇතිවන ප්‍රමාදය හේතුවෙන් ඇතිව තිබූ විනිමය හුවමාරු පාඩුව 237,537 ක් විය.

4.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

(අ) ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සඳහා නව ගොඩනැගිල්ල ඉදිකිරීම පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වලින් ප්‍රධාන අඩුපාඩුවල සාරාංශයක් පහත දැක්වේ.

(i) ~~ආයතනය හා නෙදර්ලන්ත රජය අතර 2006 මැයි 30 දින ඇති කරගත් ගිවිසුම අනුව~~ ගිවිසුම් කාලය 2008 දෙසැම්බර් නිම වියයුතු අතර, නිම කර තිබුණේ 2010 අගෝස්තු මාසයේදීය.

(ii) නිවැරදි මිණුම් නොගැනීම, මිල වෙනස්වීම් සඳහා කොන්ත්‍රාත් ගෙවීම්, ගොඩනැගිල්ල අසල ඉදිකල පොකුණට අවිධිමත් ලෙස ගෙවීම, ප්‍රමාණ පත්‍රයේ සඳහන් රේට් ගණන් වලට වඩා වැඩි ප්‍රමාණයක් කොන්ක්‍රීට් සඳහා ගෙවීම යන කාරණා සඳහා රු. 6,184,914 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(iii) ප්‍රමාණ පත්‍රයේ අයිතම 7.1.10 සඳහා (in flower through in pond No. 2) රු.33,000 ක අමතර ගෙවීම් අනාවරණය වුවද ඒ සඳහා රු. 376,750 ක් ගෙවා ඇති බව උපදේශක සමාගම වාර්තා කර තිබුණි.

(iv) ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව නියමිත කාලයට නිම නොකිරීම නිසා රු. 5,885,281 ක විනිමය අලාභයක් සිදුවී තිබුණි.

(v) 2011 අප්‍රේල් 20 වන විට ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ රු. 1,852,607 ක් වටිනා වැඩ කොටස් 07 ක් නිම නොකර අසම්පූර්ණව පැවතුණි.

(vi) වැඩිපුර ගෙවන ලද රු. 5,669,449 ක මුදලට දඩ පොළී අයකර නොතිබුණි.

(vii) ලබාදිය හැකි අත්තිකාරම් මුදල ඉක්මවා 43% ක අත්තිකාරම් ගෙවා තිබුණි.

(viii) කොන්ත්‍රාත් ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් ආයතනයේ ගෙවන ලද රු.මි. 13 ක් සඳහා දින 170 කට පොළී මුදල්ද, නොකල වැඩ සම්බන්ධයෙන් 20% ක මුදලක්ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ix) සැලසුම් අනුව බිත්ති කොන්ක්‍රීට් වලින් නිම කිරීම වෙනුවට ගඩොල් මගින් බිත්ති නිම කර තිබුණ අතර අපේක්ෂිත නිර්මාණකරණයට ලඟා වී නොතිබුණු බව නිරීක්ෂණය කෙරේ.

(ආ) ගිවිසුම් ප්‍රකාරව ඉටුකල යුතු රු. 126,242,254 ක් වැඩ ඉටු කිරීම සඳහා උප කොන්ත්‍රාත් 33 කට පවරා තිබුණි. නියැදි පරීක්ෂණය අනුව පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 වගන්තියට අනුව කොන්ත්‍රාත් මුදලින් 5% කට නොඅඩු වටිනාකමක් සඳහා කාර්යසාධන සුරක්ෂණයක් ඉදිරිපත් නොවුණි.

| කොන්ත්‍රාත්තුවේ නම | කොන්ත්‍රාත් පිරිවැය |
|---|---|
| | රු. |
| කාපට් ටයිල් | 4,830,872 |
| ඇලුමිනියම් බෙදා වෙන්කිරීම් | 5,704,871 |

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 වගන්තියට අනුව කොන්ත්‍රාත් මුදලින් 20% ක උපරිම අත්තිකාරම් මුදලක් ගෙවිය හැකි වුවද එම සීමාව ඉක්මවා රු.5,427,402 ක මුදලක් අත්තිකාරම් ලෙස ලබාදී තිබුණි.

| කොන්ත්‍රාත්තුවේ නම | කොන්ත්‍රාත් වටිනාකම | ගෙවූ අත්තිකාරම් මුදල | 20% වැඩි මුදල |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| කාපට් ටයිල් | 4,830,872 | 2,829,510 | 1,863,336 |
| ඇලුමිනියම් බෙදා වෙන්කිරීම් | 5,704,871 | 4,322,157 | 3,181,183 |
| ගිනි ආරක්ෂක හා වැළැක්වීමේ පද්ධතිය | 2,079,660 | 798,820 | 382,883 |
| එකතුව | | | 5,427,402 |

(iii). පහත සඳහන් රු.12,615,403 වටිනාකම් වූ උපකොන්ත්‍රාත් 3 ක් වෙනුවෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තියට අනුව ගිවිසුම්වලට නොඑළඹීම.

| කොන්ත්‍රාත්තුවේ නම | කොන්ත්‍රාත් වටිනාකම |
|---|---|
| | රු |
| කාපට් ටයිල් | 4,830,872 |
| ඇලුමිනියම් බෙදා වෙන්කිරීම් | 5,704,871 |
| ගිනි ආරක්ෂන හා වැලැක්වීමේ පද්ධතිය | 2,079,660 |
| එකතුව | 12,615,403 |

4.4 කාර්ය මණ්ඩලය

ආයතනය විසින් අනුමත කල කාර්ය මණ්ඩලයක් සහ සංවිධාන සටහනක් පවත්වා ගෙන ගොස් නොතිබුණ අතර විගණනයට ලද තොරතුරු අනුව 2011 නොවැම්බර් 22 දිනට ආයතනයේ සේවයේ තියුතු කාර්ය මණ්ඩලය 49 ක් බව නිරික්ෂණය විය.

---

5. ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය

5.1 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂයේදි අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මකවී නොතිබුණි.

5.2 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් තීරණ සම්බන්ධ ඉදිරි පියවර

සමාලෝචිත වර්ෂයේදි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 02ක් පවත්වා තිබූ අතර, එම රැස්වීම් වාර්තා තීරණ ක්‍රියාත්මක කිරිම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය.

(ඈ) <u>2011 මාර්තු 18 දින පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම වාර්තාවේ 50.1 වගන්තිය</u>

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විදේශ අධාර මත ව්‍යාපෘති කටයුතු මෙහෙයවා වියදමෙන් වැඩි ප්‍රතිශතයක් විදේශාධාර හා අනෙකුත් මෙහෙයුම් ආදායමින් කටයුතු කරන ආයතනයක් බැවින් විගණකාධිපතිගේ වාර්තා වලින් පෙන්වා දෙනු ලබන රාජ්‍ය මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහ හා රාජ්‍ය භාණ්ඩාගාර චක්‍රලේඛවලට පටහැනිව කටයුතු කරන බව සඳහන්වීම ආයතනයට විශාල ගැටළුවක් හා බාධාවක් බව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා කර තිබුණු බව එම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවල දක්වා තිබුණි. එමෙන්ම 2011 ජූලි 13 රැස්වීමේ දී මේ කරුණු සම්බන්ධව සාකච්ඡා කර පහත සඳහන් යෝජනා ඉදිරිපත් කර තිබුණි.

(i) ස්වාධීන ආයතනයක් ලෙස කටයුතු කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.

(ii) 1999 සංශෝධිත පනත අවලංගු කර ගැනීම.

(iii) ලාභ නොලබන සමාගමක් ලෙස කටයුතු කිරීම.

ඉහත කරුණු සම්බන්ධව ගනු ලැබූ ඉදිරි පියවරයන් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණ අතර සමාලෝචිත වර්ෂයේදීත් රාජ්‍ය මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහ රෙගුලාසි හා වෙනත් චක්‍රලේඛවලට පටහැනිව කටයුතු කල අවස්ථා නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ). ලැබිය යුතු මුදල්

(ආ). ලේඛණ පවත්වාගෙන යාම

(ඇ). කොන්ත්‍රාත්තු පිරිනැමීම හා පාලනය.

එච්.ඒ.එස්. සමරවීර,

විගණකාධිපති.

## විගණන වාර්තාවට කළමණාකාරිත්වයේ පිළිතුර

යොමු අංකය: EL/A/IPS/FA/2011

### 2.2.1. ගණකාධිකරණ අඩුපාඩු/ඌනතා

(අ). රු 82,900,000 ක්වූ HSBC බැංකුවෙහි ස්ථිර තැන්පතුව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සමග සම්බන්ධ වූවක් නොවේ. එය පරිත්‍යාග අරමුදල යටතේ ලබා ගන්නා ලද තැන්පතුවකි. මේ පිළිබඳ විගණනය සිදුවූ අවස්ථාවේ විගණන කණ්ඩායමට පැහැදිලි කරන ලදි.

(ආ). අය විය යුතු පොලිය නිසි ලෙස ගණනය කොට ඇත. බැංකුව 2012 වසර සඳහා වූ පොලී ඇතුලත් ශේෂය තහවුරු කරන විට වැරදි ලෙස තහවුරු කර තිබිණ.

(ඇ). රුදවුම්බද්ද සඳහා වූ ශුද්ධ පොලිය ගණනය කොට ඇත. එහෙයින් රුදවුම් බද්ධ අඩුකර පොලිය නිවැරදි ලෙස සටහන් කිරීම පිණිස නිවැරදි පොලිය පෙන්වා ඇත.

### 2.2.2. සසඳන නොලද ගිණුම් ශේෂ

ඇමතුම් තැන්පතු සඳහා වූ රු. 3154 පොලිය ගණනය කිරීමේ කාලය පිළිබඳ ගැටළුවකි. එය භෞතික ලෙස සැලකිය නොහැක. මෙවන් තත්වයක් ඇතිවීමට හේතුව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය දින ගණන අතින් ගණනය කිරීමේ ක්‍රමයට ගණනය කරන විට බැංකුව එය ස්වයංක්‍රිය ක්‍රමයට ගණනය කර තිබීමයි.

012-139630-040 අංකය හිමි HSBC ගිණුමෙහි බැංකු ප්‍රකාශයේ ශේෂය HSBC බැංකුවේ බැංකු සැසඳීම සකස්කිරීමට නිවැරදිව යොදාගෙන ඇත. එනිසා එහි පරස්පරතාවයක් නොමැත.

| | | |
|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් ගිණුම් ශේෂය | හර | රු.95,693,748.74 |
| අඩුකරන්න : භාණ්ඩාගාර බිල්පත් වාරික ගිණුම | බැර | රු.13,763 |
| ගිණුම් සහ බිල්පත් වට්නාකම් අනුව | | |
| මුළු භාණ්ඩාගාර බිල්පත් | | රු.95,769,986 |
| අය විය යුතු පොලී ගිණුම | හර | රු.3,838,524.67 |
| එකතු කරන්න : උපචිත පොලී ආදායම | හර | රු.1,376.20 |
| ගිණුම අනුව අය විය යුතු මුළුපොලී ප්‍රමාණය | හර | රු.3,839,901 |

### 2.2.3 අය විය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

(අ). ගමන් වාරය සිදුවී මාසයකට හෝ මාස දෙකකට පසු ගුවන් ටිකට් පත් සඳහා වූ ප්‍රතිපූරණ ලබා නිම කර ඇත.එහෙත් එම මුදල් වහා ලබා නොගන්නා ලද අවස්ථාවන්වල එය ලබා ගැනීමේ දී යම් ප්‍රමාද ඇතිවිය. එවන් ලබා ගත යුතු මුදල ආපසු ලබා ගැනීමට ගත යුතු සියළු ප්‍රයත්නයන් ගෙන ඇති හෙයින් දීර්ග කාලීනව හිඟව තිබෙන මුදල් විගණනයද පෙන්වා දී ඇති අයුරින කපා හැරිය හැක. එය 2012 සිදු කරනු ලබයි.

(ආ). රජයේ දීමනාව වූ රු.793,845 ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට 2010 වසරේ නොගෙවන ලදි. මෙම මුදල භාණ්ඩාගාරය විසින් ලබා නොදෙන බව මුදල් අංශය දැනගැනීම මත 2011 වසරේ ආරම්භයේදී එය කපා හැරීම සඳහා විධායක අධ්‍යක්ෂකගේ අනුමැතියට යොමු කරන ලදි. එහෙත් භාණ්ඩාගාරය එම මුදල නිදහස් කළ හැකියයි වූ අවබෝධය මත එය අනුමත නොකරන ලදි. විගණනය පෙන්වා දී තිබෙන අයුරින්, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය එම මුදල නැවත ලබා ගැනීමට අවස්ථාවක් ඉදිරියට නොමැති හෙයින් විධායක අධ්‍යක්ෂකගේ අනුමැතිය මත එම මුදල 2012 වසරේ කපා හැරිය හැක.

(ඇ). ව්‍යාපෘති අංක 297 සඳහා ජාත්‍යන්තර පර්යේෂණ ආයතනයෙන් ලැබීමට නියමිත රු.97,861 ක මුදල ලබා ගැනීමට ගතයුතු සියළු උත්සහයන් දරා ඇත. එම මුදල 2009 වසරේ සිට හිඟව පවතින බැවින් 2012 වසරේ එය කපා හැරිය හැක.

(ඇ) රු.101,200 ක්වූ මුදල, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙන් භාණ්ඩාගාරයට යෝජනා කරන ලද පර්යේෂණ නිලධාරින් දෙදෙනාගේ සේවාව සඳහා වූ හිග ගෙවීමක් ලෙස භාණ්ඩාගාරයෙන් අය විය යුතු මුදලකි. මෙම හිග මුදලින් කොටසක් ලබාගෙන ගෙවීම් හමාර කර ඇත. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහ භාණ්ඩාගාරය යන ආයතන දෙකහිම අදහස් අනුව ලේඛන කටයුතු ඉතිරිව ඇති හෙයින් මෙම මුදල හිග මුදලක් ලෙස පවතියි. මෙය 2012 වසරේ කපා හැරිය හැකිය.

(ඉ). ගොඩනැගිලි කොන්ත්‍රාත්කරු කේ. ඩී. ඊබර්ට් නැමැත්තාට ගෙවීමට තිබෙන රු. 4,958,668 රඳවා ගන්නා ලද මුදල 2011 දෙසැම්බර් 31 න් නිමවූ වසර සඳහා වූ ගණන් වල හෙළි නොකරන ලදි. ගැටළු සහිත මෙම මුදල .අඩුපාඩු රාශියකින් සමන්විත දීර්ඝ ලැයිස්තුවක් සහ ඒ හා සම්බන්ධ අඩුකිරීම් හේතුවෙන් නොගෙවන බවට අවබෝධයක් ඇතිකර ගන්නා ලද බැවින් එම මුදල ගිණුම් වල නොපෙන්වන ලදි. අවශ්‍යතාවයක් පැන නැගුනේ නම් මෙය ගිණුම් වල පෙන්විය හැකියි. නමුත් අඩුපාඩු තවමත් පවතියි. තවද මෙම මුදලද නොගෙවනු ලබයි.

(ඊ). වසර අවසානයේ දි සම්පූර්ණ නොකරනල ද ව්‍යාපෘති ඉදිරියට ගෙන යනු ලැබ ඇත. වැඩ නිම නොවූ හේතුවෙන් මෙම ව්‍යාපෘති සඳහා වූ ආදායම පිළිගත නොහැක. එහෙයින් භාවිතයට නොගන්නා ලද මුදල් විලම්බිත ආදායම් ලෙස හඳුන්වා දී ඇත.

රු.311,005 ක් වූ ව්‍යාපාරික ණය ලාභින්ගෙන් අය විය යුතු මුදල් වල පහත සඳහන් මුදල් පමණක් ශේෂයක්ව පවති. නමුත් එය ලබා ගැනීමට උත්සහයන් රාශියක් දරා ඇත.

| ව්‍යාපෘති අංකය | විස්තරය | දායකයා | මුදල රු. |
|---|---|---|---|
| 1. 248 A | MDG ශේෂය පිළිබඳ වාර්ථාව<br>(වාර්ථාව අවසර ලෙස මුද්‍රණය කර ඇත) | මුදල් අමාත්‍යංශය | 216,712 |
| 2. PJ007F | ඉන්දු/ලංකා නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ අත් පොත | ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය | 403,760 |

## 2.2.4. විගණනය පිළිබඳ සාක්ෂි නොතිබීම

(අ). තහවුරු කිරීම් සියළුම බැංකු වලින් කැඳවන ලදි. 2536901 දරණ අංකය සහිත ගිණුමෙහි ශේෂය වූ රු.9,890 පිළිබඳ මහජන බැංකුව පිළිතුරක් ලබා දුන්නේ නැත. මෙම තහවුරු කිරීම් ලැබුනේ මාර්තු මස 31 වන දිනයි .එය දැන් ලිපිගොනුවේ ඇත.

(ආ). ඉඩම පිළිබඳ දිගු කාලීන බදු ගිවිසුම අද දක්වා ලබාගෙන නොමැත.

## 2.2.5. නීති රීති රෙගුලාසි සහ කළමණාකාරිත්ව තීරණ සමග එකග නොවීම.

(අ) මුල් සැපයීමේ ස්වභාවය නිසා (ව්‍යාපෘති මූල්‍යය මත රැදී සිටීම) සේවකයින් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලබයි.

(ආ) ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ශ්‍රී ලංකා රජයේ ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි වලට යටත් ආයතනයක් නොවේ. 1998 අංක 53 දරණ ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනතේ වගන්ති 6 (අ), ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන .ආයතනයේ පාලන සභාවට සහ එහි කළමණාකාරිත්වයට තමන්ගේ ස්වයං නීති සහ රෙගුලාසි සම්පාදනය කර ගැනීමේ සම්පූර්ණ බලය ලබාදි ඇත. ඒ අනුව ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ක්‍රියාකාරි සැලැස්ම පාලනය කිරීම සඳහා වූ කාර්‍ය පටිපාටිය සකස් කරනු ලබ ඇත. ඒ නිසා සේවක සංඛ්‍යාව, බ|වා ගැනිම්, උසස්වීම් සහ වැටුප් වේතනාදින් ඇතුලත් දීමනා පිළිබඳ මෙම කාර්යය පටිපාටිය අනුව තීරණය වේ. තවද එය භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා යොමු කරනු නොලබයි. තවද .භාණ්ඩාගාරයේ ලේකම් මෙම ආයතනයේ පාලක සභා සමාජිකයෙකු වන කරුණ ද සැලකිල්ලට ගත යුතුයි.

මුදල් සහ ක්‍රම සම්පාදන ආමාත්‍යංශයේ දේශිය අයවැය දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂ වන සී.එස්.පෙරේරා මහතා වෙත පාලක සභාව විසින් අනුමත කරන ලද මෙම ක්‍රියා පටිපාටිය 2010 නොවැම්බර් මස 12 වන දින යවන ලදි. එයට කිසිදු පිළිතුරක් නොලැබුනේය.

(ඇ). 2003 වසරේ සිට ලබා ගෙන ඇති වෛද්‍ය රක්ෂණය වාර්ෂිකව අලුත් කිරීමට හේතු වූයේ සෙලින්කෝ රක්ෂණ සමාගම විසින් වාරික මුදලෙහි සුළු වැඩි කිරීමක් සමග විශිෂ්ට පාරිභෝගික සේවාවක් සමග රක්ෂණ ක්‍රමය වැඩි දියුණු කර දීමයි. ශ්‍රී ලංකා රක්ෂණ සමාගමේ වාරික මුදල සෙලින්කෝ රක්ෂණ සමාගමේ වාරික මුදලට වඩා ඉතා අධික බව පෙනුනි. මිල ගණන් කැඳවනු ලැබූ විට ශ්‍රී ලංකා රක්ෂණ සමාගම විසින් අපට යවන ලද ලිපියෙහි සෙලින්කෝ රක්ෂණ සමාගම ලබා දීමට ඉදිරිපත් වූ ප්‍රතිලාබ සහ වාරික මුදල තමන් විසින් ලබා දීමට නොහැකි බව සඳහන් කර තිබිනි. විගණනයට එම ලිපියද ඉදිරිපත් කරන ලදි. එහෙයින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ස්වයං මූල්‍ය මත රඳා සිටින අතර එවැනි ගෙවීම් වලට රජයේ ආධාර නොලැබෙන හෙයින් වෛද්‍ය රක්ෂණය ශ්‍රී ලංකා රක්ෂණ සමාගමට මාරු කිරීමට නොහැක.

(ඈ). රු 51,678,914 ක් වූ වියදමට ජනාධිපති ලේකම් කාර්යාලය විසින් අනුමැතිය ලබා ගන්නා ලදි. ඒ පිළිබඳ ලිපිය විගණන කමිටුවට පෙන්වන ලදි.

ශ්‍රවනාගාර උපකරණ මිලදී ගනු ලැබුවේ ගොඩනැගිලි ක්‍රියාකාර කමිටුවේ නිර්දේශය මතයි.

සියලු භාණ්ඩ මිලදී ගැනීම් සඳහාම මිල ගණන් තුනක් කැඳවනු ලැබිය. එය අවශ්‍යතා අනුව අනුමත කරනු ලැබූ අතර විධායක අධ්‍යක්ෂ විසින් පත්කරනු ලැබූ කණ්ඩායමක් මගිනි.

### 3. මූල්‍ය අධ්‍යයනය

### 3.1 මූල්‍ය ප්‍රතිපත්ති

2011 වසරේ රු 343,442 අතිරික්තයක් සඳහන් කරනු ලැබිය.

### 4. ක්‍රියාකරවන අධ්‍යයනය

### 4.2 කළමණාකාරිත්ව අකාර්යක්ෂමතා

(අ). සේවක සුභ සාදක ආයෝජනය අවශ්‍ය වූ විට ප්‍රයෝජනයට ගන්නා ලදි. 2011 වසරේ අවශතා නොතැගුණු හෙයින් එය ප්‍රයෝජනයට ගනු නොලැබිය එයට ප්‍රධාන හේතුව සේවක සුභ සාදක වියහියදම් වලට I DRC TTI මුල්පිරිමෙන් දිගු කාලීන දීමනා ලබා ගැනීමයි. එම නිසා (පුහුණු කිරීම් ඇතුලත්) සුභ සාධක අවශ්‍යතා ඉහත අයවැය තිරුව යටතේ සිදු කරන ලදි.

(ආ) ගොඩනැගිලි ව්‍යාපෘතින් මත විදේශ විනිමය අලාභය වාර්තාවීමට ප්‍රධානතම හේතුව කොන්ත්‍රාත්කරු විසින් ගොඩනැගිලි ව්‍යාපෘතිය ප්‍රමාද කිරීමයි.

### 4.3 කොන්ත්‍රාත් පාලනයේ අඩුපාඩු

ඉහත කරුණු පිළිබඳ උපදේශකයන්ගේ සවිස්තර වාර්තාව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ කාර්යාලයේ ඇත. තවද එය විගණන කමිටුවට පෙන්වන ලදි

### 5. වගකීම සහ යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයක් දැන් ස්ථාපනය කර ඇත. විගණන කණ්ඩායමේ ඉල්ලීම අනුව කාර්තුවක් සඳහා විගණනයක් ද පවත්වා ඇත.

### 5.2 අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ පිළිබඳ අනුගාමී ක්‍රියා මාර්ග

පාලක සභා රැස්වීම් සමාන්‍යයෙන් වසරකට දෙවතාවක් පමණක් පවත්වනු ලබයි .එනමුත් පාලක සභාවේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කරුණු කිසිවක් නොමැතිව වසරකට වැඩි රැස්වීම් පැවැත්වීමට නොහැක. තවද රැස්වීම් සඳහා වූ ගණපූර්ණය ලබා ගැනීමද බොහෝවිට අසීරු කරුණකි.

පාලක සභා තිරණ වලට අනුව අනාගත කරුණු තිරණය කරණු ලබයි. එනම්:

(අ) ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ස්වාධින ආයතනයක් ලෙෂ පත් කිරිම පිළිබඳ පාලක සභා සාකච්චාවල ප්‍රතිඵල

(ආ) ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනතෙ ඇතිකරනු ලැබූ 1999 සංශෝධනය අහෝසි කිරිම.

(ඇ) ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ලාභ ඉපැයිම සඳහා නොවන සමාගමක් ලෙස පත් කිරිම පිළිබඳ විගණනයට නොපත්වීමට හේතුවූයේ ඒ පිළිබඳ කිසිදු ක්‍රියාමාර්ගයක් ගනු නොලැබිමයි. පාලක සභාව මේ පිළිබඳ සාකච්චා පවත්වා ඇත. වැඩි දුර කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොමැත.

## ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
## මූල්‍ය ප්‍රගති ප්‍රකාශනය

| *දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා* | සටහන | 2011<br>රු | 2010<br>රු |
|---|---|---|---|
| **ආදායම** | | | |
| ශ්‍රී ලංකා රජයේ දායකත්වය | 2 | **12,701,000** | 10,793,845 |
| රක්ෂණ අරමුදල් දායකත්වය | | **7,500,000** | - |
| ව්‍යාපෘති ආදායම | 3 | **54,160,812** | 30,017,784 |
| සම්මන්ත්‍රණ වැඩමුලු ආදායම | 4 | **3,996,181** | 7,100,539 |
| පොලී ආදායම | | **14,569,419** | 17,775,479 |
| ගොඩනැගිලි ක්ෂය කිරීමෙන් ලැබූ ආදායම | | **6,274,023** | 1,504,124 |
| ශ්‍රවණාගාරය කුලියට දීමෙන් ලැබූ ආදායම | | **222,140** | - |
| විවිධ ආදායම් | 5 | **1,774,036** | 1,251,942 |
| **ආදායම් එකතුව** | | **101,197,612** | 68,443,714 |
| **වියදම්** | | | |
| සේවක වැටුප් | 6 | **46,371,858** | 40,651,046 |
| දේපල. යන්ත්‍ර සහ උපකරණ ක්ෂය වීම් | 13 | **16,521,793** | 5,722,590 |
| පර්යේෂණ වියදම | 7 | **13,289,655** | 11,755,459 |
| සම්මන්ත්‍රණ සහ වැඩමුලු වියදම | | **1,425,719** | 6,148,813 |
| උපයෝගිතා වියදම | | **15,450,470** | 19,913,582 |
| ගමන් වියදම් | | **1,212,923** | 1,926,865 |
| අනෙකුත් කාර්‍ය වියදම | 8 | **3,485,215** | 5,755,210 |
| ශ්‍රවණාගාරය කුලිය | | **75,677** | - |
| විනිමය පාඩුව | | **3,020,860** | 2,864,421 |
| **මුලු වියදම** | | **100,854,170** | 94,737,985 |
| **බදු අය කිරීමට පෙර අතිරික්ත/හිග** | | **343,442** | (26,294,271) |
| අය බදු ආදායම | 9 | 0 | - |
| **කාලසීමාව සඳහා අතිරික්ත/හිග** | | **343,442** | (26,294,271) |

## ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
## මූල්‍ය තත්ව ප්‍රකාශනය

| *දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා* | සටහන | 2011<br>රු | 2010<br>රු |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් සහ ඒ සමාන වත්කම් | 10 | **18,064,518** | 12,938,296 |
| වෙළෙඳ අය | | **1,311,005** | 2,787,936 |
| භාණ්ඩ ලේඛන සහ ප්‍රකාශන | | **1,535,187** | 1,520,329 |
| තැන්පතු සහ පූර්ව ගෙවීම් | 11 | **2,240,133** | 2,892,874 |
| ලැබිය යුතු පොලී | | **3,839,901** | 1,228,147 |
| ලැබිය යුතු වැටි ආදායම | | **710,098** | 0 |
| ලැබිය යුතු අනෙකුත් ආදායම් | 12 | **4,085,528** | 8,959,780 |
| **ජංගම වත්කම් මුළු එකතුව** | | **31,786,369** | 30,327,362 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 13 | **360,016,948** | 340,926,955 |
| ආයෝජන | 14 | **188,586,304** | 218,468,324 |
| **ජංගම නොවන වත්කම් මුළු එකතුව** | | **548,603,252** | 559,395,279 |
| **වත්කම් මුළු එකතුව** | | **580,389,621** | 589,722,640 |
| **බැරකම්** | | | |
| **ජංගම බැරකම්** | | | |
| වෙළෙඳ සහ අනෙකුත් ගෙවීම් | 15 | **13,389,653** | 8,934,622 |
| ව්‍යාපෘති සඳහා අත්තිකාරම් ලැබීම් | 16 | **17,091,061** | 26,679,276 |
| **ජංගම බැරකම් එකතුව** | | **30,480,713** | 35,613,898 |
| **ජංගම නොවන බැරකම්** | | | |
| සේවක ප්‍රතිලාභ | 17 | **9,027,633** | 7,478,652 |
| සේවක සුභසාධක අරමුදල | | **1,164,402** | 982,636 |
| විලම්බිත ආදායම - ප්‍රාග්ධන ප්‍රදානය | 18 | **305,858,626** | 312,132,649 |
| **ජංගම නොවන බැරකම් එකතුව** | | **316,050,660** | 320,593,937 |
| **බැරකම් මුළු එකතුව** | | **346,531,374** | 356,207,834 |
| **ශුද්ධ වත්කම්** | | **233,858,248** | 233,514,806 |
| **ශුද්ධ වත්කම් /සමාන කොටස්** | | | |
| ප්‍රාග්ධන දායකත්වය | | | |
| සමුච්චිත ලාභය | | **231,714,104** | **231,370,662** |
| රජයෙන්/දීමනාකරුවන්ගෙන් වත්කම් ප්‍රාරම්භක මාරු කිරීම් | | **2,144,144** | **2,144,144** |
| | | **233,858,248** | **233,514,806** |

මූල්‍ය ප්‍රකාශනයට අමුණා තිබෙන කරුණු, මෙම මූල්‍ය ප්‍රකාශනයේ අත්‍යාවශ්‍ය කරුණු වේ.
මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රජයේ ගණකාධිකරණ ප්‍රමිතින් සහ ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතින් අනුකූලව සකස් කර ඇත.

..............................  ..............................

ප්‍රධාන මූල්‍ය නිලධාරි  විධායක අධ්‍යක්ෂ

ආයතනයේ පාලන මෙම මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමෙහිලා වගකීමෙන් බැඳී සිටියි.
පාලක මණ්ඩලය වෙනුවෙන් සහ සඳහා අනුමත කර අත්සන් කරන ලදී

..............................

පාලක
2012 පෙබරවාරි 28

## ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
## කොටස් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

*දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා*

| | වත්කම් | අතිරික්ත/හිග | එකතුව |
|---|---|---|---|
| | රු | රු | රු |
| **2010 ජනවාරි 01 දිනට ශේෂය** | 2,144,144 | 231,370,662 | 233,514,806 |
| වර්ෂය තුළ අතිරික්ත ආදායම | - | 343,442 | 343,442 |
| **2011 දෙසැම්බර් 31දිනට ශේෂය** | **2,144,144** | **231,714,104** | **233,858,249** |

## ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

### මූල්‍ය ගැලීම් ප්‍රකාශනය

| *දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා* | 2011 | 2010 |
|---|---|---|
| | රු | රු |
| **මෙහෙයුම් කර්‍යයන්ගෙන් මුදල් ගැලීම්** | | |
| බදුකරණයට පෙර අතිරික්ත/හිග | **343,442** | (26,294,271) |
| **ගැලපීම්** | | |
| කාර්‍ය මණ්ඩල සුභ සාධන අරමුදලේ දායකත්වය | 181,766 | 79,954 |
| දේපල පිරියත සහ උපකරණ ක්ෂය වීම | 16,521,793 | 5,722,590 |
| ගොඩනැගිලි ක්‍රමක්ෂය කිරිමෙන් ලැබූ ආදායම | (6,274,023) | (1,504,124) |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 2,117,104 | 3,363,362 |
| පොලි ආදායම | (14,569,419) | (17,775,479) |
| ස්ථාවර වත්කම් අපහණය කිරිමෙන් ලැබූ ලාභ/අලාභ | (860,000) | (520,873) |
| කාරක ප්‍රාග්ධන වෙනස් වීම් වලට පෙර ශුද්ධ මූල්‍ය ගැලම් | (2,539,337) | (36,928,841) |
| වෙළෙඳ ලැබීම් අඩුවීම් | 1,476,931 | 2,240,822 |
| ඉන්වෙන්ටරි වැඩිවීම්/අඩුවීම් | (14,858) | 247,545 |
| තැන්පතු සහ පූර්ව ගෙවීම් අඩුවිම | 652,741 | 5,133,490 |
| වැටි සහ අනෙකුත් ලැබීම් වැඩිවීම්/අඩුවීම් | 4,164,141 | (2,425,983) |
| අත්තිකාරම් ලැබීම් වැඩිවීම්/අඩුවීම් | (9,588,215) | 14,527,587 |
| වෙළෙඳ සහ අනෙකුත් ගෙවීම් වල වැඩිවිම/අඩුවිම | 4,455,031 | 4,795,021 |
| මෙහෙයුම් මගින් ඉපයූ ශුද්ධ මූල්‍ය ගැලීම් | (1,393,567) | (12,410,359) |
| පාරිතෝශික ප්‍රතිපාදන | (568,123) | (412,300) |
| ක්‍රියාකාරකම් මෙහෙයවිම තුලින් ලැබූ ශුද්ධ මූල්‍ය ගැලීම් | (1,961,690) | (12,822,659) |
| ආයෝජන කටයුතුවලින් ලැබූ මූල්‍ය ගැලීම් | | |
| දේපල පිරියත සහ උපකරණ මිළදී ගැනීම් | (44,925,938) | (117,742,105) |
| ක්‍රියාත්මක මූලධන කාර්යයන්ගේ වැඩිවිම/අඩුවිම | 9,314,164 | |
| පොලි ලැබීම් | 11,957,665 | 25,450,700 |
| දේපල පිරියත සහ උපකරණ අපහරණයෙන් අලෙවි ප්‍රගමණය | 860,000 | 914,362 |
| ආයෝජන අලෙවිය/මිළදී ගැනීම | 57,899,593 | (93,342,699) |
| ආ෫ අලෙවියෙන් මූල්‍ය ගැලීම් | (28,017,573) | 153,688,252 |
| ආයෝජන ක්‍රියාරකම් වලින් ශුද්ධමූල්‍ය ගැලීම් | 7,087,912 | (31,031,491) |
| මූල්‍ය  කටයුතුවලින් මූල්‍ය ගැලීම් | | |
| | 0 | |
| ප්‍රදාන ලැබීම් | 0 | 48,214,520 |
| මූල්‍ය කටයුතු තුලින් ශුද්ධ මූල්‍ය ගැලීම් | 0 | 48,214,520 |
| මුදල් සහ ඒ සාමාන ප්‍රතිපාදන ශුද්ධ අඩුවීම්/වැඩිවීම් | 5,126,222 | 4,360,370 |
| වර්ෂය මුල මුදල් සහ ඒ සාමාන දෑ (සටහන10) | 12,938,296 | 8,577,926 |
| වර්ෂය අවසානයේ මුදල් සහ ඒ සාමාන දෑ (සටහන10) අ. | 18,064,517 | 12,938,296 |
| අ. මුදල් සහ මුදල් සහ ඒ සාමාන දෑ සැසඳිම | | |
| බැංකු තැන්පතු | 18,024,517 | 12,901,296 |
| අත ඇති මුදල් | 40,000 | 37,000 |
| | 18,064,517 | 12,938,296 |

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

**මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්**

**2011 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා**

1. පිහිටීම හා නෛතික ආකෘතිය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 1988 දෙසම්බර් මස පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත කරන ලද අතර ඇය 1990 අප්‍රේල් මස ගැසට් නිවේදනයක් මගින් නෛතික ආයතනයක් ලෙස පිහිටුවෙන ලදි. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ (IPS) ලියාපදිංචිකාර්යාලය කොළඹ 07. නිදහස් මාවත අංක 100/20 දරන ස්ථානයේ පිහිටා ඇත.

1.1. ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම් ස්වභාවය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රධාන කාර්යය ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්තිමය ආර්ථික පර්යේෂණ හා මධ්‍ය කාලීන ප්‍රතිපත්ති විශ්ලේෂන කිරීමවේ.

1.2. සැකසුමේ පදනම

1.2.1. අනුකූලතා ප්‍රකාශනය

මෙම ආයවනය මූල්‍ය ප්‍රකාශනය මූල්‍ය ප්‍රගතිය. මූල්‍ය තත්වය. කොටස්හි වෙනස්වීම්. මූල්‍ය ගැලි ප්‍රකාශනය පිළිබඳ සටහන් වලින් සමන්විත වේ. මෙම ප්‍රකාශ ශ්‍රී ලංකා වරලත් ගණකාධි කරණ ආයතනය මගින් පනවා ඇති රාජ්‍ය ක්‍ෂෙස්ත්‍රය සඳහාවූ රජයේ ගණකාධි කරණ ප්‍රමිතීන් වලට අනුකූලව සකස්කොට ඇත.

2011 ජනවාරි 01 දිනයන් හෝ ඊට පසු ආරම්භ වන මුදල් වර්ෂයේ සිට ක්‍රියාත්මක පරිදි මෙම ආයතනය විසින් ශ්‍රී ලංකා රාජය ක්‍ෂෙස්ත්‍රයේ ගණකාධිකරණ ප්‍රමිතීන් භාවිතා කොට ඇත. එහෙත් මෙම ප්‍රමිතීන් බාවිත කළද .ඊට පෙර වර්ෂවල ගණන් හිලව් සම්භන්ධ කර නොමත.

1.2.2 මැනුම් පදනම

මූල්‍ය ප්‍රකාශය ඉකුත් පිරිවැය පදනම යටතේ සකස්කොට ඇත.

1.2.3 ක්‍රියාකාරිත්වය පිළිබඳ ඇගයීම

අනාගතයේ මෙහෙයුම් සිදුකළ හැකි ආකාරයේ සම්පත් වල තුලනතාව පිළිබඳ පාලක මණ්ඩලය තෘප්තිමත්ව සිටි එහෙයින් මූල්‍ය ප්‍රකාෂය ක්‍රියාකාරිත්වය පිළිබඳ තෘප්තිමත් පදනම යටතේ සකස්කොට ඇත.

1.3 සුවිශේෂි ගිනුම් ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

සමුච්චිත ලාබ / හිහ සංචිත යටතේ කොටස් වල වෙනස් වීම් සම්භන්ධ ප්‍රකාශයේ සටහන් කර ඇති ගිනුම ප්‍රතිපත්තිවල පාරිතෝෂික ප්‍රතිපාදන වැනි කරුණු හැර මෙම ප්‍රතිපත්ති සැම වර්ෂයක් සඳහාම අදාල කරගෙන ඇත.

අ. විදේශ විනිමය ගණුදෙණු

මෙම මූල්‍ය ප්‍රකාශ . ආයතනයේ ක්‍රියාකාරි විනිමය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කොට ඇත.

ගණුදෙණු සිදුවන අවස්ථාව වනවිට පැවති විනිමය අනුපාතවලට අනුකූලව විදේශ විනිමය ගණුදෙණු ගණනය කර ඇත. ඒවැනි ගණුදෙණුහිදී මෙන්ම විදේශ මුදල් මගින් සිදුවන මූල්‍ය ප්‍රාග්ධනය හා බැරකම්වල පරිවර්තන ද හේතුවන් ලැබෙන ලාභ හා පාඩු පිළිබඳ මූල්‍ය ප්‍රකාශයේ සඳහන්ව ඇත. එවෙනි හිහ වර්ෂාවසාන විනිමය අනුපාත යටතේ දක්වා ඇත.

ආ. දේපල . පිරියත හා උපකරණ

දේපල . පිරියත හා උපකරණ පිළිබඳ කරුණු සමුක්චිත හා අපචය අලාභ යටතේ දක්වා ඇත.

පසු වියදම්

දේපල . පිරියත හා යන්ත්‍රවල කොටසක් දැම්ම සම්බන්ධයෙන් කරුණු වෙන් වෙන් වශයන් ගිණුම් ගත කර ඇත. ප්‍රධාන පිරික්සුම් හා පිරික්සුම් වියදම් ඇතුලු වියදම් සඳහා මුදල් සපයා ඇත. අනෙකුත් පසු වියදම් දේපල . පිරියත හා යන්ත්‍ර ආදියෙන් ලබාගත හැකි අනාගත ආර්ථිකමය වාසි වැඩිවීම මත මූල්‍ය කරණය කොට ඇත. අනකුත් වියදම් මූල්‍ය ප්‍රකාශයේ වියදම් ලෙස සඳහන් කොට ඇත.

ඍජු ක්‍රමය යටතේ වාර්ෂිකව පහත සඳහන් අනුපාත භාවිත කරමින් ක්‍ෂය ගණනය කොට ඇත. එය ඇස්තමේන්තුගත වත්කම් වල භාවිතයට ගත හැකි ආර්ථික මය ආයු කාලය පදනම් කොටගත ඇත.

| | |
|---|---|
| පරිගණක උපකරණ | 33 % |
| වෙබ් අඩවි සැකස්ම | 33 % |
| යතුරු පැදි | 20 % |
| ලී බඩු | 20 % |
| කාර්යාල උපකරණ ර. විදුලි උත්පාදන යන්ත්‍ර | 20 % |
| වාහන | 20 % |
| පුස්තකාල පොත් | 25 % |
| ගොඩනැගිලි | 2 % |

වත්කම් සම්බන්ධ ක්ෂයවීම වත්කම භාවිතය සඳහා යොදා ගන්නා අවස්ථාවේ සිට ආරම්භවන අතර ඇය අලෙවිය සඳහා තීරණය කර දිනයෙහි එහි ක්ෂය අවසන් වේ.

අපචය

දේපළ . පිරියත හා උපකරණ වල පවත්නා වටිනාකම ආවරණය කල නොහැකි අවස්ථා ඇති වූ විට එහි පවත්නා වටිනාකම අපචය සඳහා නම් කෙරේ. වත්කමක පවත්නා වටිනාකම එහි ආවරණ වටිනාකමට වඩා වැඩිවන අවස්ථාවක එහි පවත්නා වටිනාකම ආවරණ වටිනාකම දක්වා කපා හැරේ.

ඇ. කල්බදු

බදු හිමියා වත්කම් කල්බදු කිරීම සම්භන්දයන් සියලු අවදානම් මෙන්ම ලාබ පිළිබඳ වගකීම දරණ අවස්ථාවක එය කල්බදු මෙහෙයවීම ලෙස වර්ග කොට ඇත. කල්බදු කාල සීමාව තුල ඍජු පදනම යටතේ මෙම කල්බදු මෙහෙයුම් වල ගාස්තු මූල්‍ය ප්‍රගතියේ අන්තර්ගත වේ.

මෙහෙයුම් කල්බදු අවසන්වන දිනට පෙර එය අහවර කිරීමේ අවස්ථාවකදී නීතිමය පදනමක් යටතේ බදුහිමියා හට ගාස්තුවක් ගෙවීමට නියම කල විට එය අහවර කල කාල සීමාවේදී පැන නගින වියදමක් ලෙස දැක්වේ.

ඇ. ආයෝජන

මෙම ආයෝජන තුල ස්ථාවර තැන්පතු . භාණ්ඩාගාර බිල්පත බැඳුම්කර හා නැවත මිලදී ගැනීම ගිණුම් ඇතුලත් වේ.

I. ස්ථාවර තැන්පතු

ස්ථාවර තැන්පතු වෙනුවෙන් ආයෝජනය කිරීම පිරිවැයක් ලෙස ගිණුම් ගත කෙරේ. මූල්‍ය තත්වය සම්බන්ධ ප්‍රකාශය දක්වන දිනට එකතු වූ පොලිය පොලි ලැබීම් ලෙස දක්වා ඇත.

II. භාණ්ඩාගාර බිල්පත්. භාණ්ඩාගාර බැඳුම්කර හා නැවත මිලදී ගැනීම ගිණුම.

මූල්‍ය තත්වය සම්බන්ධ ප්‍රකාශය දක්වන දිනට භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර පිරිවැය එකතු කල පොලී ලෙස සඳසනත කර ඇත.

ඊ. ප්‍රාග්ධන ප්‍රධාන

දේපල. පිරියත හා උපකරණ සම්බන්ද ප්‍රදන ජංගම නොවන බැරකම් යටතේ විලම්බිත ආදායම් ලෙස අන්තර්ගත කොට ඇති අතර අදාල වත්කම් ක්ෂය පදනම් කොට ගෙන මූල්‍ය ප්‍රකාශයට ඇතුලත් කොට ඇත.

උ. ඉන්වෙන්ටරි

ප්‍රකාශන තොගයකින් ඉන්වෙන්ටරි සමන්විත වේ. එය පිරිවැයක් ලෙස සඳහන් කොට ඇත. අවුරුදු 10 කට වඩා භාවිත කර ඇති ඉන්වෙන්ටරි මන්දගාමී ක්‍රියාකාරිත්වයකින් යුතු බව සලකා කපා හැරීමට කටයුතු කෙරේ.

ඌ. අයවීම්

අයවීම් අපේක්ෂිත උපලබ්ධිත වටිනා කම වෙත රැගෙන යාම සිදුවේ ණයකරුවන් පිළිබඳ සේමවිටම විවරණය කරණු ලබයි. ලබාගත නොහැකි යයි සලකන ණය කපාහැරේ. බොල් ණය හඳුනා ගත් වර්ෂයේදීම කපාහැරේ.

එ. මුදල් හා ඒ සමාන දෑ

මූල්‍ය ගැලීම් ප්‍රකාශයේ මුදල් හා ඒ සමාන දෑ යන්නට බැංකු මුදල්. අතනි ඇති මුදල්. ඉල්ලුම් තැන්පතු හා බැංකු අයිරා වලින් සමන් විත වේ. ශේෂ පත්‍රයේ බැංකු අයිරා බැරකම් යටතේ සඳසන්ව ඇත.

ඒ. බැරකම් හා ප්‍රතිපාදන

මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම බැරකම් ලෙස සඳසන් බැරකම් මූල්‍ය තත්ව ප්‍රකාශ දිනයේ සිට වර්ෂයක් තුල හෝ ඉල්ලූ විට ගෙවිය යුතු වියදම් ලෙස වර්ග කෙරේ. ජංගම නොවන බැරකම් යනු ශේෂ පත්‍ර දිනයේ සිට වර්ෂයක් අවසානයේදී ගෙවිය යුතු වියදම් ය. මෙවැනි සියලු බැරකම් මෙම මූල්‍ය ප්‍රකාශ සකස්කිරීමේදී අදාල කොට ගෙන ඇත.

අතීත ක්‍රියාකාරකම් හේතුවෙන් යම් කණ්ඩායමක් සම්බන්ධ නෛතිකමය හෝ නිර්මාණය කොට ගත් බැඳීම් ඇති වූ අවස්ථාවකදී බැරකම් සඳහා ප්‍රතිපාදන හඳුනා ගනු ලබන අතර මෙම බැරකම් පියවීම සඳහා විශාල ආර්ථිකමය ප්‍රතිලාභ අත්‍යවශ්‍යවේ.

ඔ. සේවක ප්‍රතිලාභ

I. නිශ්චිත දායක සැලසුම්

ආයතනයේ සියලු සේවකයන් සේවක අර්ථ සාධක අරමුදලේ හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලේ සාමාජිකයන් වන අතර ඒ සඳහා ඔවුන් ගේ වේතනයන් පිළිවලින් 12 % හා 3 % වශයෙන් දායකත්වය ලබාදෙයි

II. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

ආයතනයේ සේවකයන් සඳහා නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් ලෙස ඒකක මූල්‍ය ක්‍රමය භාවිත කරමින් පාරිතෝෂික විශ්‍රාම ප්‍රතිලාභයේ පවත්නා වටිනාකම ගණනය කරණු ලබයි.

සැලසුම සඳහා ඉදිරියට ඇති අපේක්ෂිත ශ්‍රමයේ සාමාන්‍ය මත ආදායම හෝ වියදම ලෙස ලාභ හා පාඩු හඳුනා ගනු ලබයි.

ඕ. ආදායම් හඳුනා ගෙනීම

I. ශ්‍රී ලංකා රජයෙa දායකත්වය

උපලබ්ධිත පදනම මත ශ්‍රී ලංකා රජයෙa දායකත්වය හඳුනා ගැනේ.

II. ව්‍යාපෘති ආදායම්

ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘත අවසන් කර ඇති අදියර මත පදනම්ව ආදායම් ගණනය කෙරේ. ව්‍යාපෘතියක අත්තවකාරම් ලැබීම් විලම්බිත ආදායම් ලෙස වර්ගීකරණය කොට මූල්‍ය ප්‍රකාශය තුල ජංගම බැරකම් ලෙස ඉදිරිපත් කොට ඇත.

III. සම්මන්ත්‍රණ / වැඩමුළු වලින් ආදායම් ලැබීම

උපලබ්ධිත මත පදනම්ව සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවත් වූ විට එහි ආදායම ගණනය කෙරේ.

IV. පොලී ආදායම

උපලබ්ධිත පදනම මත පොලී ආදායම ගණනය කෙරේ.

ඖ. ප්‍රාග්ධන වියදම් හඳුනා ගැනීම

ව්‍යාපාරය පවත්වාගෙන යෑමේදී හෝ ඉපැයීම් ශක්‍යතාවය ඉහළ නැංවීමේදී හෝ ස්ථාවර ස්වභාය මූලධන වත්කම් අත්පත් කර ගැනීම, පුලුල් කිරීම හෝ ඉහළ නැංවීමේ අරමුණින් මෙම වියදම් පැන නගී.

වියදම් වර්ගී කරණය

මූල්‍ය ප්‍රගති ප්‍රකාශය ඉදිරිපත් කිරීමේදී වියදම් ක්‍රමෝපායයන් ආයතනයේ මූලිකාන්ගේ හොඳින් පිලිබිම්බු කරණ බවට එහි පාලක මණ්ඩලය විශ්වාස කරන බැවින් මෙම මූල්‍ය ප්‍රකාශය සඳහා එවැනි ක්‍රමෝපායක් බාවිත කර ඇත.

## ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
## මූල්‍ය ප්‍රකාශනය ප්ල්බඳ සටහන්

*දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා*

2. ශ්‍රී ලංකා රජයේ ආයකත්වය
ආයතනය කුලියට ගැනීමට සහ නඩත්තුව සඳහා ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන ලැබීම්

| | 2011<br>රු | 2010<br>රු |
|---|---|---|
| 3. . ව්‍යාපෘති ආදායම | | |
| ව්‍යාපෘතිය තුලින් ලැබූ ආදායම | 32,713,173 | 29,339,789 |
| ජාත්‍යාන්තර සංවර්ධන පර්යේෂණ කේන්ද්‍රයෙන් ලැබූ ආදායම | 21.447.639 | 677,996 |
| | 54,160.812 | 30,017,784 |

4. සම්මන්ත්‍රණ සහ වැඩමුලුවලින් ලැබූ ආදායම
දායකයින්ගේ ඉල්ලීම මත සම්මන්ත්‍රණ සහ වැඩමුලු තුලින්
ලැබූ ආදායම සහ පර්යේෂන තොරතුරු බෙදා හැරීමෙන් ලද ආදායම

| | 2011 | 2010 |
|---|---|---|
| 5. විවිධ ආදායම් | | |
| ප්‍රකාශන අලෙවිය | 746,289 | 529,388 |
| ස්ථාවර වත්කම් අලෙවියෙන් ලැබූ ලාභ | 860,000 | 520,873 |
| වෙනත් ආදායම් | 167.747 | 201.681 |
| | 1,774.036 | 1,251,942 |
| 6. සේවක වියදම් | | |
| සේවක වැටුප් | 32,626,503 | 27,674,416 |
| සේ. අ. අ | 3,916,461 | 3,295,899 |
| සේ නි භා අ | 981,008 | 828,183 |
| ප්‍රසාද දීමනා | 3,388,887 | 2,248,069 |
| සෙවක සුභසාධන වියදම | 3,681,077 | 4,703,250 |
| වෙනත් ආදායම් | 1,777,922 | 2,018,331 |
| පාරිතෝෂික ප්‍රතිපාදන අඩුවීම් (සටහන 17) | | (117,103) |
| | 46,371,858 | 40,651,046 |
| 6.1. ප්‍රසාද දීමනා | | |
| පාලක මණ්ඩලය සඳහා ගෙවීම් අන්තර්ගත වේ | 544,000 | 387,000 |
| 7. පර්යේෂණ වියදම් | | |
| මුද්‍රණය සහ පරිගණක මුද්‍රණය | 2,571,472 | 2,242,602 |
| අන්තර්ජාල ගාස්තු | 1,907,138 | 1,886,115 |
| උපදේශක ගාස්තු | 7,362,336 | 5,856,184 |
| අනෙකුත් පර්යේෂණ වියදම් | 1.448.709 | 1.770.558 |
| | 13,289,655 | 11,755,459 |
| 8. අනෙකුත් මෙහෙයුම් වියදම් | | |
| බොල් ණය | - | 520,000 |
| සාමාජිකයන් ලියාපදිංචි කිරීමේ ගාස්තු | 604,525 | 424,139 |
| මුද්‍රණ ගාස්තු | 58,993 | 18,445 |
| කාර්යාල ගාස්තු | 737,389 | 1,458,245 |
| පරිභෝජන වියදම් | 476,042 | 1,089,550 |
| වෘත්තිමය සහ නිතිමය ගාස්තු | 306,861 | 162,003 |
| විගණන ගාස්තු | 90,244 | 90,000 |
| ප්‍රචාරණය | 60,200 | 459,424 |
| බැංකු ගාස්තු/කොමිස් | 206,870 | 356,849 |
| අනෙකුත් පරිපාලන වියදම් | 119,089 | 355,755 |
| කල්බදු | 780,000 | 780,000 |
| විවිධ වියදම් | 45.000 | 40.800 |
| | 3,485,215 | 5,755,210 |

| *දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා* | | 2011<br>රු | 2010<br>රු |
|---|---|---|---|
| **9.** | ආදායම් බදු වියදම් | | |
| | ජංගම බදු වියදම්<br>1990 අංක 42දරණ දේශිය ආදායම් (සංශෝධිත) පනතේ 2(3)(බෂ.) වගන්තිය සහ 1988 අංක 53 දරණ ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පණතේ 19(4) වගන්තිය අනුව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ලාභ සහ ආදායම් බදුවලින් නිදහස් කර ඇත. | | |
| **10.** | මුදල් සහ ඒ සාමාන දෑ | | |
| | බැංකු මුදල් | 6,024,617 | 1,788,278 |
| | ඉල්ලුම් තැන්පතු | 11,999,900 | - |
| | බැංකු මුදල්- විදේශ විනිමය(සටහන 10.1) | - | 11,113,017 |
| | සුළු මුදල් | 40,001 | 37,000 |
| | | 18,064,518 | 12,938,296 |
| **10.1** | බැංකු මුදල්- විදේශ විනිමය | | |
| | යූරෝ ගිණුම | - | 11,113,017 |
| | | - | 11,113,017 |
| **11.** | තැන්පතු සහ පූර්ව ගෙවීම් | | |
| | පූර්ව ගෙවීම්(සටහන 11ග1) | **1,676,423** | 1,212,298 |
| | තැන්පතු | **296,000** | 696,000 |
| | ගොඩනැගිලි අනු කොන්තාත්කරුවන්ට අත්තිකාරම් | | 937,516 |
| | අනෙකුත් අත්තිකාරම් | **267,710** | 47,060 |
| | | **2,240,133** | 2,240,133 |
| **11.1** | පූර්ව ගෙවීම් | | |
| | වෛද්‍ය රක්ෂණ | **855,957** | 809,266 |
| | අනෙකුත් රක්ෂණ | **397,484** | 385,552 |
| | වෙනත් පූර්ව ගෙවීම් | **422,982** | 17,480 |
| | | **1,676,423** | 1,212,298 |
| **12.** | අනෙකුත් ලැබීම් | | |
| | අනෙකුත් ලැබීම්(සටහන 12ග1) | **1,914,624** | 7,111,030 |
| | සේවක මණ්ඩල ණයකරුවන් | **2,170,903** | 1,792,746 |
| | ජා.ගො.බ. ලැබීම් | - | 56,004 |
| | | **4,085,528** | 8,959,780 |
| **12.1** | අනෙකුත් ලැබීම් | | |
| | ශ්‍රී ලංකා රජයේ දායකත්වය- 4වන කාර්තුව සඳහා ප්‍රතිපාදන | **793,845** | 5,793,845 |
| | දායකයින් විසින් කාර්ය මණ්ඩල ගුවන් ටිකට්පත් ප්‍රතිපූර්ණය කිරිම | **851,475** | 1,084,975 |
| | අනෙකුත් ලැබීම් | **269,304** | 232,210 |
| | | **1,914,624** | 7,111,030 |

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ සටහන්

*දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා*

13. දේපල, පිරියත සහ උපකරණ

| මිල | බදු ඉඩම ගොඩනැගිලි | පරිගණක උපකරණ | මෝටර් රථ | ගෘහ භාණ්ඩ සහ උපකරණ | කාර්යාලය උපකරණ | පුස්තකාල පොත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | රු | රු | රු | රු | රු | රු | රු |
| 2011 ජනවාරි 01 දිනට ශේෂය | 300,824,754 | 31,481,429 | 10,604,125 | 13,547,166 | 8,367,873 | 1,234,366 | 366,059,713 |
| එකතු කිරීම් | 23,244,225 | 2,409,415 | - | 5,429,440 | 13,837,358 | 5,500 | 44,925,938 |
| අඩුකිරීම් - අපහරණ | - | - | - | - | - | - | - |
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | | | | | | | - |
| | 324,068,979 | 33,890,844 | 10,604,125 | 18,976,606 | 22,205,231 | 1,239,866 | 410,985,651 |
| සමුච්චිත ක්ෂය | | | | | | | |
| 2011 ජනවාරි 01 දිනට ශේෂය | 1,504,124 | 21,732,949 | 7,964,124 | 1,213,954 | 814,554 | 1,217,205 | 34,446,910 |
| ක්ෂය ගාස්තු | 4,637,866 | 4,245,613 | 1,320,000 | 3,369,610 | 2,945,488 | 3,216 | 16,521,793 |
| අඩුකිරීම් - අපහරණ | | | | | | | - |
| 2011දෙසැම්බර් 31 දිනට ශේෂය | 6,141,990 | 25,978,562 | 9,284,124 | 4,583,564 | 3,760,042 | 1,220,421 | 50,968,703 |
| ඉදිරියට ගෙන ගියා | | | | | | | |
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | **317,926,989** | **7,912,283** | **1,320,001** | **14,393,042** | **18,445,189** | **19,445** | **360,016,948** |
| 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය | 299,320,631 | 9,748,479 | 2,640,001 | 12,333,212 | 7,553,318 | 17,161 | 331,612,802 |

## ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
## මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ සටහන්

| *දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා* | | 2011 | 2010 |
|---|---|---|---|
| | | රු | රු |
| 14. | ආයෝජන | | |
| | නැවත මිළදී ගැනීම් ගිවිසුම් | **13,915,303** | 98,475,670 |
| | භාණ්ඩාගාර බිල්පත් (සටහන 14ග1) | **95,679,986** | 69,419,418 |
| | භාණ්ඩාගාර බිල්පත් (සටහන 14ග1)-පරිතෝෂික අරමුදල | **11,065,712** | 10,847,270 |
| | භාණ්ඩාගාර බිල්පත් (සටහන 14ග1)- සුභ සාධක අරමුදල | **1,176,955** | 995,191 |
| | භාණ්ඩාගාර ඇපකර (සටහන 14ග1) | **0** | 19,911,976 |
| | ස්ථාවර තැන්පතු | **66,748,349** | 18,818,800 |
| | | **188,586,304** | 218,468,324 |
| 14.1 | ආයෝජන වල වෙළෙඳ පොල වටිනාකම | | |
| | භාණ්ඩාගාර බිල්පත් | **107,616,895** | 81,267,450 |
| | භාණ්ඩාගාර ඇපකර | | 20,942,320 |
| | | **107,616,895** | **102,209,769** |
| 15. | වෙළඳ සහ අනෙකුත් ගෙවීම් | | |
| | ණය කරුවන් | **10,561,838** | 5,893,135 |
| | උපලබ්ධ(සටහන 15.1) | **2,105,649** | 2,100,525 |
| | ගෙවිය යුතු අත්හිටවූ බදු | **(25,237)** | 771,462 |
| | අගරු චෙක් පත් පාලන ගිණුම | **0** | 169,500 |
| | ගෙවීමට ඇති සේ.අ.අ. | **636,032** | **0** |
| | හර්ඹ ගෙවීම් | **18,042** | **0** |
| | උ.වි.ගෙ | **93,329** | **0** |
| | | **13,389,653** | 8,934,622 |
| 15.1 | උපලබ්ධි | | |
| | පර්යේෂණ ව්‍යාපෘති වියදම් | **628,179** | 896,312 |
| | දුරකතන අන්තර්ජාල ගාස්තු | **280,000** | 696,993 |
| | විගණන ගාස්තු | **415,000** | 325,000 |
| | විදුලිය | **578,832** | 160,000 |
| | අනෙකුත් කාර්යාලය වියදම් | **94,462** | 22,219 |
| | ඉන්ධන | **109,175** | **0** |
| | | **2,105,649** | 2,100,525 |
| 16. | ව්‍යාපෘති සඳහා අත්තිකාරම් ලැබීම | | |
| | ජනවාරි 01 දිනට ශේෂය | **26,679,276** | 12,151,689 |
| | වර්ෂය තුළ ලැබීම් | **48,568,778** | 51,645,910 |
| | හඳුනාගත් ආදායම් | **(58,156,993)** | (37,118,324) |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය | **17,091,061** | 26,679,276 |

ශේෂ පත්‍රයේ ඇතුලත් නොවන සම්පූර්ණ නොකල ව්‍යාපෘති වල ආදායම එම ව්‍යාපෘති කාලය තුළ ලැබීමට ඇති ආදායමක් ලෙස හඳුනාගත යුතු වේ. ආනාගතයේ අපේක්ෂිත ව්‍යාපෘති ලැබීම් ප්‍රමාණයෙන් මෙම ව්‍යාපෘති වල වියදම පියවා ගැනීමට හැකි වෙන බවට ඇස්තමේන්තුකර ඇත.

# ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
## මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ සටහන්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | | 2011 | 2010 |
|---|---|---|---|---|
| 17ග | සේවක ප්‍රතිලාභ | | | |
| | ජනවාරි 01 දිනට ශේෂය | | 7,478,652 | 4,527,590 |
| | වර්ෂය තුළ හඳුනාගත් වියදම්(සටහන 17.1) | (Note 17.1) | 2,117,104 | 3,363,361 |
| | වර්ෂය තුළ ගෙවීම් | | (568,123) | (412,300) |
| | | | 9,027,633 | 7,478,651 |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය | | 9,027,633 | 7,478,651 |

2011දෙසැම්බර් 31 දිනට ආයතනයේ සේවක සංඛ්‍යාව -56කි(2010 - 61)

2011දෙසැම්බර් 31 දිනට සේවක ප්‍රතිලාභ සඳහා සුදුසුකම්ලැබූ සේවක සංඛ්‍යාව 46 කි(2010-46)

බැරකම් බාහිර වශයෙන් සැපයීම සිදුනොකල අතර වෘත්තීමය රක්ෂණ සාමාගමක් විසින් මෙම ප්‍රතිලාභ සැපයීමේ දී ආයතන වියදම් තිරිණයකිරීමසඳහා පහතසඳහන් උපලේඛන

| | | |
|---|---|---|
| වට්ටම් | 10.50% | (2009-11%) |
| වේතන වැඩිමේ අනුපාතය | 5% | (2009-5%) |
| කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාතය | 7% | |

| | | 2011 | 2010 |
|---|---|---|---|
| 17.1 | වර්ෂය තුළහඳුනාගත් වියදම් | රු | රු |
| | ජංගම සේවා පිරිවැය | 811,998.00 | 768,105.00 |
| | පොලි වියදම | 785,258.00 | 498,035.00 |
| | රක්ෂත ලැබීම්/අලාභ | 519,848.00 | 2,097,221.00 |
| | | 2,117,104.00 | 3,363,361.00 |
| | | - | |

| | | 2011 | 2010 |
|---|---|---|---|
| | | රු | රු |
| 18. | විලම්භිත ආදායම-මූලධන ප්‍රධාන | | |
| | ජනවාරි 01 දිනට ශේෂය | 312,132,649 | 265,422,253 |
| | වර්ෂය තුළ ලැබූ ප්‍රදාන | - | |
| | නෙදර්ලන්ත රජයෙන් ලැබූ ප්‍රදාන | - | 13,214,520 |
| | රක්ෂණ අරමුදලෙන් ලද ප්‍රදාන | | 35,000,000 |
| | වර්ෂය තුළ ක්‍රමක්ෂය | (6,274,023) | (1,504,124) |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය | 305,858,626 | 312,132,649 |

**19. කල්බදු බැදීම්**

වසර 30 කාල පරිච්ඡේදයක් සඳහා කල් බදුක්‍රමය යටතේ ඉඩම් කොමසාරිස් යටතේ තිබෙන ඉඩමක ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් වර්ෂයකට රුපියල් 7 80 000.00 බැගින් වර්ෂික කුලියක් ගෙවීමට මෙම ආයතනය වගකීමෙන් බැදී සිටියි. කෙසේවුවද ශ්‍රී ලංකා රජයෙන් මෙම ඉඩම පූර්ණ ප්‍රදානයක් ලෙස

| | |
|---|---|
| වර්ෂයකට වඩා අඩු | රු. 780,000 |
| වසර 1-5 අතර | රු. 3,900,000 |
| වසර 5ට වැඩි | රු. 14,040,000 |

**20. ප්‍රාග්ධන බැදීම්**

2011.12.31දිනට ප්‍රාග්ධන බැදීම් නොමැත

**21. ආදාල පාර්ශව ගණුදෙනු**

ආයතනය සහ රක්ෂණ අරමුදල ද පාලනය වන්නේ එකම පාලක මණ්ඩලයක් යටතේය. වර්ෂය තුළ ආයතනික මෙහෙයුම් සඳහා රු 7,500,000.00 ක මුදලක් ආයතනය වෙත ලැබී ඇත
පුනරාවර්ථන වියදම් සඳහා ශ්‍රී ලංකා රජය විසින් රු 14,000,00.00 ක මුදලක් ආයතනය වෙත පරිත්‍යාග

කර ඇත. භාණ්ඩාගාර ලේකම් ප්‍ර.ස.ආයතනයේ පාලක මණ්ඩල හිටපු සාමාජිකයෙකි.

**22. අවිනිශ්චිත බැරකම්**

ශේෂපත්‍ර දිනට අවිනිශ්චිත බැරකම් නොමැත.

**23. ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්**

මූල්‍ය ප්‍රකාශනයේ සංශෝධන හෝ අනාවරණ අවශ්‍ය වෙන ආකාරයේ වෙනස් වීම් ශේෂපත්‍ර දිනට පසුවසිදු විනොමැත

**24. පාලක මණ්ඩලයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී. ලං. ප්‍ර. අ. ආ. ගි.ප්‍රමිතින් ප්‍රකාර සැකැසීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පාලක මණ්ඩලය වගකීමෙන් බැදී සිටියි ශ්‍රී. ලං. ප්‍ර. අ. ආ. ගි. ප්‍රමිතින් නොමැති විටෙක ශ්‍රී.ලං.ගි.ප්‍ර. භාවිත කෙරේ.

Research. Inform. Impact.

100/20, Independence Avenue, Colombo 7, Sri Lanka, Tel: +94-11-2143100/2665068, Fax: +94-11-2665065, E-mail: ips@ips.lk URL: http://www.ips.lk,
Blog 'Talking Economics': www.ips.lk/talkingeconomics, Twitter: @TalkEconomicsSL, Facebook: www.facebook.com/instituteofpolicystudies